**වයඹ පළාත් සභාව - 2025**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

වයඹ පළාත් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2026 මැයි 29 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2026 ජූනි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2025 දෙසැම්බර් 31 දිනට වයඹ පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 වර්ෂයේ දී ගිනිතබා සම්පූර්ණයෙන් විනාශ කර තිබූ ආණ්ඩුකාරවර කාර්යාලය සතුව පැවති රු.24,000,000 ක් වටිනා ලෑන්ඩ් රෝවර් ඩිස්කවරි රථය තවදුරටත් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කර තිබුණි. | අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු පරීක්ෂණ වාර්තාව ලද පසු අනුමැතිය ලබාගෙන ඉවත් කිරීමට කටයුතු කරන බව. | දේපළ, පිරියත උපකරණ නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බැරකම් ලේඛනයට හා මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනානොගත් සමාලෝචිත වර්ෂයේ බැරකම් වටිනාකම රු.186,097,136 ක් විය. | මෙවන් වැරදි අවම කිරීමට පියවර ගන්නා බව. | නිවැරදි වටිනාකම් ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු රු.3,330,000 ක් වටිනා මෝටර් රථය භාවිතයෙන් ඉවත්කර පැවතියද සමාලෝචිත වර්ෂය අවසන් වන තෙක්ද අපහරණය කිරීමට කටයුතු කර නොතිබූ අතර, 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | අපහරණ කටයුතු සඳහා ප්‍රධාන ලේකම් කාර්යාලයට යොමුකර ඇති බව. | අපහරණය කරන තෙක් ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් නාත්තණ්ඩිය පුහුණු මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් 2021 වර්ෂයේ සිට 2023 දක්වා දරන ලද ප්‍රාග්ධන වැය රු.72,635,253ක් ප්‍රාග්ධනිත කිරීමකින් තොරව එක් එක් වර්ෂවලදී වර්ෂයේ ආදායමට එරෙහිව වියදමක් ලෙස කපා හැර තිබුණි. | පිළිගන්නා බව. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 07හි 19 වගන්තිය ප්‍රකාරව යටිතල පහසුකම් සපයනු ලබන වත්කම් යටතේ වන විදුලි පද්ධති දේපල පිරියත උපකරණ යටතේ ගිණුම්ගත කළයුතු නමුත් දූපත් සඳහා ලබාදුන් රු.4,822,702 ක සූර්යබල විදුලි පද්ධති වියදම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | ප්‍රවර්ථන වර්ෂයේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරිත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාත්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිත භාවය සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.5.1 ශීර්ෂය - 201 වයඹ ආණ්ඩුකාරවරයා

#### 1.5.1.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුකාරවරයාගේ නිල නිවස සඳහා 2025 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා ජල බිල්පත් සඳහා රු.104,583 ක්, විදුලිය සඳහා රු.293,943 ක් ගෑස් සඳහා රු.43,917 ක් ලෙස එකතුව රු.442,443 ක් වැය කර තිබුණු අතර එම ගෙවීම් සඳහා අධිකාරි බලය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | ගෙවීම් සඳහා පදනම් කරගත් අනුමැතීන් නිශ්චිතව හඳුනාගැනීම අපහසු වී ඇත. අදාළ අයතන විමසා එම ගෙවීම් සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව. | අධිකාරි බලය හඳුනාගෙන ගෙවීම් කටයුතු කළ යුතුය. |

### 1.5.2 ශීර්ෂය 203 - වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

#### 1.5.2.1 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වයඹ පළාත් සභාවේ නිලධාරීන් දෙදෙනෙකු සම්බන්ධයෙන් චෝදනා පත්‍ර නිකුත් කර 2025 අගෝස්තු 31 දිනට වසර 1 සිට වසර 2 මාස 09 ක කාලයක් ගතව ඇතත් විනය නියෝග ලබා දී නොතිබුණ අතර, නිලධාරීන් 05 දෙනෙකු සම්බන්ධයෙන් චෝදනා පත්‍ර නිකුත් කිරීම හා විනය නියෝග ලබා දීම අතර අවුරුදු 02 ත් අවුරුදු 04 ත් අතර කාල ප්‍රමාදයක් පැවතුණි. | විනය පරීක්ෂණයක් සඳහා චෝදනා පත්‍ර නිකුත් කිරීම සහ පරීක්ෂණයෙන් අනතුරුව විනය නියෝගය ලබාදීම අතර යම් කාල සීමාවක් පවතින බව හා චෝදනා පත්‍රය සහ විනය නියෝගය නිකුත් කිරීම අතර පුළුල් වූ කාර්යභාරයක් පවතින බව. | අසාමාන්‍ය ලෙස කාල ප්‍රමාද වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.2.2 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාතේ, පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 වන පන්තියේ 1 (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීමේ විභාගය - 2024 හා වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ කණිෂ්ඨ සේවකයින් වයඹ පළාත් සභා කළමනාකරණ සේවා නිලධාරි සේවයේ iii වන ශ්‍රේණියට බඳවාගැනීමේ සීමිත තරඟ විභාගය - 2024 හි උත්තර පත්‍ර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කර තිබුණු ලකුණු ලැයිස්තු මකන දියර යොදා වෙනස්කර තිබීම, මුල් අවස්ථාවේ යෙදූ ලකුණු පසුව වෙනස්කර වෙනත් ලකුණක් යොදා තිබුණු අවස්ථා පැවතුණ බැවින් බඳවාගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය තහවුරු නොවුණි. | වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉදිරියේදී සිදු කරනු ලබන බඳවා ගැනීම් විභාග වලදී සියලු නිවැරදි කිරීම් වලින් අනතුරුව පරීක්ෂකවරුන්ගේ අත්සන් හා නිල මුද්‍රා සහිත අවසන් ලකුණු ලේඛනයක් ලබා ගැනීමට කටයුතු කරන බව. | ප්‍රතිඵල ලේඛනවල විනිවිදභාවය තහවුරු වන අයුරින් කටයුතු කළ යුතුය. |

### 1.5.2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2025 දෙසැම්බර් 31 දිනට නිම නොකරන ලද විමර්ශන 42 ක් පරීක්ෂා කිරීමේදී මූලික විමර්ශන ලැබී මාස 06 ත් වසර 02 ත් අතර කාලයක් ගතව ඇතත් විමර්ශන වලට අදාළ පරීක්ෂණ කටයුතු අවසන් නොකර සිදුකරමින් පවතින අවස්ථා 12 ක්, මූලික විමර්ශන ලැබී මාස 03 ක් ගතව තිබූ නමුත් විමර්ශන සඳහා | මූලික විමර්ශන ගොනුවක් කොමිෂන් සභාවට ඉදිරිපත් වූ පසු ඒ සඳහා චෝදනා පත්‍රයක් නිකුත් කිරීම සහ විනය නියෝග නිකුත් කිරීම අතර පුළුල් වූ කාර්යභාරයක් පවතින බව. | විමර්ශන පැවැත්වීම, චෝදනාපත්‍ර නිකුත් කිරීම විනය නියෝග ලබාදීම් සම්බන්ධ කටයුතුවල ප්‍රමාදය වැළැක්වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

පරීක්ෂණ මණ්ඩල පත්කර නොතිබුණු අවස්ථා 13 ක් පැවති අතර විමර්ශන කටයුතු 04 ට අදාළ පරීක්ෂණ කටයුතු ආරම්භ කර නොතිබුණි. නිම නොකරන ලද එම ගොනු 42 න් මූල්‍ය වංචාවලට අදාළ සිදුවීම් 24 ක් හා පාසල්වල ළමා අපයෝජනවලට අදාළ සිදුවීම් 09 ක් සඳහා හෙළිදරව් වූ කරුණු මත විමර්ශන පවත්වාගෙන ගිය ද, ඉදිරියේදී එවැනි සිදුවීම් වළක්වා ගැනීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

### 1.5.3 ශීර්ෂය - 210 වයඹ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන හා පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ සංචාරක කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා

#### 1.5.3.1 නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2006 මැයි 30 දිනැති අංක 09/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2018 අගෝස්තු 01 දිනැති අංක 29/2018 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 3 ඡේදය | රජයේ පාසල්වල සේවයේ නියුතු අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ද්විතීයික මට්ටමට අයත් නිලධරයන් දිනකට පැය 7 යි විනාඩි 45 ක් සේවයේ යෙදිය යුතු වුව ද, වයඹ ප්‍රධාන ලේකම් හා වයඹ ප්‍රධාන අමාත්‍ය ලේකම්ගේ උපදෙස් පරිදි වයඹ පළාතේ පාසල්වල සේවය කරන සංවර්ධන නිලධාරීන් 2,107 ක් පමණ එම පාසලේ ගුරුවරුන් සේවය කරන රාජකාරි වේලාව තුළ එනම් පෙ.ව. 7.30 සිට ප.ව. 1.30 වන තෙක් පැය 06 ක් පමණක් සේවය කර තිබුණි. මෙම වරප්‍රසාදය හේතුවෙන් පාසල්වල අතිරික්ත නිලධාරීන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට | පාසල්වල සේවය කරනු ලබන සංවර්ධන නිලධාරින්ගේ රාජකාරි කටයුතු සංවර්ධන නිලධාරියෙක් ලෙස පමණක් නොව ඇතැම් නිලධාරින් ගුරුවරුන් ලෙසද එකී පාසැල්වල සේවය කරනු ලබන හෙයින් රාජකාරි කාලය තිරණය කිරිම පිළිබඳව අසීරුතාවයක් පෙන්නුම් කරයි.කෙසේ වෙතත් සියළු තොරතුරු අධ්‍යයනය කර යෝජනා ඉදිරිපත් කිරිමට අදාල නිලධාරින් දැනුවත් කර ඇති බව. | 2026 මැයි 20 දිනැති අංක 11/2025 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය අනුව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | හෝ කලාප අධ්‍යාපන කාර්යාලය වෙත අනුයුක්ත කිරීමට නොහැකි වී තිබුණි. | |

### 1.5.3.2 කාර්යභාරයන් ඉටුනොකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාතේ ජනතාවට ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක උදෙසා ගොඩනැගෙන ප්‍රජා මූල සංවිධාන නියාමනය වයඹ පළාත් ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ඒකකයේ මූලික අරමුණ වුවත් 2019 - 2025 වර්ෂවල ක්‍රියාත්මක ජල ව්‍යාපෘති 79 කින් ජනතාව වෙත බෙදාහැරෙන ජලයේ රසායනික හා ශාබානුවේදීය ජල සාම්පල පරීක්ෂණ පිළිගත් පරීක්ෂණාගාරයකින් සිදු කර ගත යුතු වුවත්, ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. | 2019 සිට 2025 වර්ෂය දක්වා ක්‍රියාත්මක කළ ප්‍රති ආශ්‍රිත ජල පිරිපහදු පද්ධතිවල පිරිපහදු ජලයේ රසායනික හා ශාබානුවේදීය පරීක්ෂණ වාර්තාවල පිටපත් මෙම ඒකකය වෙත ලබාගැනීමක් සිදු නොකරන අතර, මෙම තත්ත්වය මත එම පිටපත් විගණනය වෙත ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව. | ප්‍රජාමූල සංවිධාන වෙත ලබා දී ඇති මාර්ගෝපදේශ අනුව ජල සාම්පල් පරීක්ෂාව පිළිබඳව අධීක්ෂණය කළ යුතුය. |

### 1.5.3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2021 වර්ෂයේ හා 2023 වර්ෂයේ පිළිවෙලින් රු.8,827,020 ක් හා රු.9,445,604 ක් වැය කර සිදු කරන ලද ගල්ගමුව ඉහළ දිගන ගම්මානයේ ජලපහසුකම් සහ සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජල ටැංකියේ ඉදි කිරීම හා ජලනල එලීමේ කටයුතු සිදු කර තිබුණු නමුත් නිවාස 295 ඉලක්ක ප්‍රතිලාභ ප්‍රමාණය අතුරින් සමාලෝචිත වර්ෂයේ අවසන් වන විටද, නිවාස 40 කට පමණක් ජලය ලබා දීම හේතුවෙන් ව්‍යාපෘතියේ කාර්ය සාධනය | ගල්ගමුව ඉහළ දිගන ජල ව්‍යාපෘතිය ආරම්භ කරන අවස්ථාවේදී ප්‍රජා මූල සංවිධානයේ සාමාජිකයින් 295 ක් පමණ සාමාජිකත්වය ලබාගෙන තිබුණද, මෙම ව්‍යාපෘතිය නිමකිරීමටද හැකිවූයේ අදියර කිහිපයක් ඔස්සේ බැවින් ව්‍යාපෘතිය නිමකරන අවස්ථාව වන විට බොහෝ පිරිසක් එම සාමාජිකත්වයෙන් ඉවත්ව ගොස් වෙනත් ජල පහසුකම් සපුරාගෙන තිබුණි. කෙසේ වෙතත් දැනට මෙම ව්‍යාපෘතියෙන් සාමාජිකයින් 98කට පමණ ජලය ලබාදී ඇති බව | නියමිත කාලය තුළ නිමකර ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලැබීමට සලස්වා ව්‍යාපෘති කාර්ය සාධනය ඉහළ නැංවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සියයට 13 ක අවම මට්ටමක පැවතුණි. | කාරුණිකව සඳහන් කරන අතර,තව දුරටත් ජලය ලබාගැනීමට අපේක්ෂාවෙන් අයදුම්පත් 10 ක් පමණ ඉදිරිපත් වී ඇති බවද එම ප්‍රජා මූල සංවිධානයෙන් දැනගන්නට ලැබුණු බව. | |

### 1.5.3.4 ව්‍යාපෘති නිමනොකර අත්හැර දැමීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේ ආරම්භ කළ වයඹ ජනකලා පදනම සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා විගණන දිනය වූ 2026 ජනවාරි 24 දින වන විට රු.210,296,578 ක වියදමක් දරා තිබුණු නමුත් එම ඉදි කිරීම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් නිෂ්කාර්යව පැවතුණි. | පළාත් භාණ්ඩාගාරයේ 2025 දෙසැම්බර් 17 දිනැති අංක NWP/PT/Ap/06 දරන ලිපිය මගින් 2026 වර්ෂය සඳහා රු.මිලියන 300 ක උපරිමයක් තුළ ප්‍රතිපාදන සලසා දී ඇති අතර ඉදිකිරීමට අදාළ මූලික කටයුතු ආරම්භ කර ඇති බව. | වියදම් / ප්‍රතිලාභ පිළිබඳව විශ්ලේෂණය කර නිවැරදි ශක්‍යතා අධ්‍යනයක් සිදුකර ව්‍යාපෘති ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.4 ශීර්ෂය - 211 වයඹ පළාත් පාලන දෙපාර්තමේන්තුව

### 1.5.4.1 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල අධිභාර සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන ලේඛන හා ලිපි ගොනු අනුව 1994 හා 1995 වර්ෂවල වයඹ පළාතේ පළාත් පාලන ආයතනවල කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපති විසින් නිකුත් කර තිබුණු අධිභාර සහතික 02 ක වටිනාකම වූ රු.1,839,452ක් සම්බන්ධයෙන් 2025 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | තවදුරටත් අයවිය යුතු අධිභාර මුදල ලෙස රු.1,839,452 ක මුදලක් පවතින අතර, පළාත් පාලන අමාත්‍යාංශ උපදෙස් අනුව කටයුතු කරන බව. | අධිභාර කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.5 ශීර්ෂය - 212 වයඹ පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුව**

**1.5.5.1 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | | |
| **(i)** | VIII වැනි පරිච්ඡේදයේ 3.2 ඡේදය | අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වූද, සාමාන්‍ය වැඩ කටයුතු වලින් ඒකාන්තයෙන්ම බැහැරවූද,හදිසි වූද, සාමාන්‍ය කාර්යාල වේලාව තුල කල නොහැකිවූද වැඩ සඳහා පමණක් වන අතර පළාත් ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ හා වාරියපොල ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ කාර්මික නිලධාරින් 13 දෙනෙකු විසින් ඔවුන්ගේ සාමාන්‍ය රාජකාරි කාලය තුල ව්‍යාපෘති ක්ෂේත්‍ර පරීක්ෂාවන් සිදුකරන ලද දිනයන්හිදි ක්ෂේත්‍ර රාජකාරි සිදුකල දිනයන් සඳහා හිමි රු.375,274 ක සංයුක්ත දිමනා හා ප්‍රවාහන දිමනා ලබාගෙන තිබූ අතර එම දිනයන්හිදි එම කාලය සඳහාම රු.347,769 ක අතිකාල දීමනා ලබාගැනීමටද කටයුතු කර තිබුණි. | ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගෙන සාමාන්‍ය රාජකාරී වේලාවෙන් පරිබාහිරව සිදුකල කාලසිමාව සඳහා අතිකාල ගෙවීමට කටයුතු කරන ලදී. අතිකාල ගෙවීම සම්බන්ධයෙන් කටයුතු කල යුතු ආකාරය 2025 දෙසැම්බර් 17 දිනැති අංක වඉඅ/ආ/04/6/1 හා 2025 දෙසැම්බර් 05 දිනැති අංක වඉදෙ/4/1/1 දරන ලිපි මඟින් උපදෙස් ලබා දී ඇත. වයඹ ප්‍රධාන ලේකම් ගේ 2025 නොවැම්බර් 25 දිනැති අංක NWP/CS/AD/15/1/1/2025 දරන ලිපි වලට අදාලව ගෙවීම් කටයුතු සිදු කර ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |
| **(ii)** | VIII වැනි පරිච්ඡේදයේ 4 ඡේදය | ක්ෂේත්‍ර නිලධාරියෙකු එනම් ප්‍රධාන වශයෙන් ක්ෂේත්‍ර වැඩ කටයුතු පැවරී ඇති එක් ස්ථානයකට සීමා | ප්‍රධාන ලේකම්ගේ 2025 නොවැම්බර් 25 දිනැති අංක NWP/CS/AD/15/1/1/2025 දරන ලිපිය මගින් විධිමත් | ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

| | | |
|---|---|---|
| | නොවන යම් කාර්යාලයක සීමා වලින් පිටත පිහිටි වැඩබිම්වලට නිතිපතා යායුතු අධීක්ෂණ ස්වාභාවයේ රාජකාරි පැවරි ඇති නිලධාරියෙකුට, මාණ්ඩලික නිලධාරින්ට අතිකාල දීමනා ලබා ගැනීමට හිමිකම් නොමැති වුවද ප්‍රධාන ලේකම්ගේ 2025 නොවැම්බර් 11 දිනැති අංක NWP/CS/AD/1/1 2025 ලිපිය ප්‍රකාරව ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂණ,වාස්තු විද්‍යාඥ,කාර්මික නිලධාරි හා සැලසුම් ශිල්පී යන තනතුරුවලට අයත් නිලධාරින්ට අතිකාල දීමනා ගෙවීමට අනුමැතිය ලබාගෙන ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ ඉංජිනේරුවරුන් 07 කට කාර්මික නිලධාරීන් 71 කට හා සැලසුම් ශිල්පීන් 03 ක් වෙත අතිකාල ලෙස රු.3,222,605 ක් 2025 වර්ෂයේ අවසාන මාස 03 සඳහා ගෙවීම්කර තිබුණි. | අනුමැතියකින් යුතුව අතිකාල දීමනා ගෙවීමට කටයුතු කර ඇති බව. |

**1.5.5.2 අත්හැර දැමූ ව්‍යාපෘති**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාරවිල මූලික රෝහලේ ළමා වාට්ටු සංකීර්ණය හා හදිසි ප්‍රතිකාර ඒකකය මහල් 05 කින් යුක්තව ඉදිකිරීම සඳහා 2019 ජනවාරි 02 දින පළමු අදියර ලෙස CESL ආයතනය සමඟ රු.45,138,012 ක කොන්ත්‍රාත් වටිනාකමකට ගිවිසුම්ගතව තිබූ අතර පළමු අදියර යටතේ පළමු මහලේ | මාරවිල මූලික රෝහලේ මහල් 05කින් යුක්තව ළමා වාට්ටු සංකීරණය හා හදිසි ප්‍රතිකාර ඒකකය ඉදිකිරීමේ පළමු අදියර 2020 වර්ෂයේ දෙසැම්බර් මස අවසන් කර ඇති අතර ඉන් පසුව වසර ගණනාවක්ම ගත වී ඇතත් ඉතිරි අදියර නිම කිරීම් සඳහා මේ | අත්‍යවශ්‍ය ඉදිකිරීම් සම්බන්ධව ප්‍රමුඛතාවය ලබා දෙමින් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| SLAB දක්වා ව්‍යුහය ඉදිකිරීම සඳහා 2020 දෙසැම්බර් 15 දින වන විට රු.47,905,434 ක වියදමක් දරා තිබූ අතර ඉන් පසුව 2020 වර්ෂයේ සිට 2025 සැප්තැම්බර් වන විටත් ඉතිරි ඉදිකිරීම් කටයුතු සඳහා වර්ෂ 05 ක් තුල සෞඛ්‍ය අමාත්‍යාංශය හරහා කිසිදු ප්‍රතිපාදනයක් වෙන්කර නොතිබුණි.වර්ෂ 05 කට වැඩි කාලයක් තුළ ගොඩනැගිල්ලෙහි ඉතිරි කොටසෙහි වැඩ ඉටුකිරීමට කටයුතු නොකිරීම තුල ගොඩනැගිල්ලෙහි කම්බි දිරායාමට පත්වන අතරම දැනට ඉදිකර ඇති ව්‍යුහාත්මක කොටසද ගරා වැටෙමින් පැවතුණි. ඒ හේතුවෙන් පළමු අදියරේදී දරන ලද රු.47,905,434 නිෂ්කාර්ය වියදමක් බවට පත්ව ඇති බව බැහැර කල නොහැකි අතරම නැවත ඉදිකිරීම් ආරම්භ කිරීමේදී විශාල පිරිවැයක් දැරීමට සිදුව තිබුණි. | දක්වා ප්‍රතිපාදන ලැබී නොමැති බව. මහල් පහකින් යුත් මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් අදියර වශයෙන් ඉදිකිරීමට අදාලව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ඇස්තමේන්තු සකස් කර ඇති මුත් ඉතිරි ඉදිකිරීම් මෙතෙක් ආරම්භ කර නොමැති බව දන්වා සිටිමි. මෙහි දෙවන අදියර ඉදිකිරීම් සඳහා සකස් කරන ලද ඇස්තමේන්තු 2021 පෙබරවාරි 23 සහ ජූනි 28 දින ලිපි මඟින් පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත යොමු කර ඇත. එසේම ගොඩනැගිල්ලේ කම්බි දිරාපත් වන බැවින් කම්බි මලකෑමෙන් ආරක්ෂා කිරීමට අදාල පියවර ගැනීම සඳහා රු. 358,000 ක ඇස්තමේන්තුවක් සකස් කර එයද යොමු කර ඇති මුත් ඒ සඳහාද ප්‍රතිපාදන ලැබී නොමැති බව. |

### 1.5.5.3 ප්‍රසම්පාදන කටයුතු

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| පන්නල ජාතික පාසලෙහි රු.5,949,440 ක කොන්ත්‍රාත් වටිනාකමක් සහිතව 2024 වර්ෂයේ ආරම්භ කළ 2025 වර්ෂයේ මාර්තු අළුත්වැඩියා කරන ලද 100 x 20 පන්තිකාමර ගොඩනැගිල්ලෙහි පිටුපස U හැඩැති කානුව නිසි නිමාවකින් තොරව සකස් කර තිබූ අතර ළමුන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමකින් තොරව ඉදිකර තිබීම හා පන්ති කාමර සඳහා ප්‍රවේශ වීමට සකස් කල Concrete slab කෙටිකාලයක් තුල කැඩී යාමටද ලක්වීම යන අඩුපාඩු භෞතික පරීක්ෂාවේදී දක්නට ලැබු අතර | කානු කැපීම වෙනුවෙන් වැය වූ මුලු මුදල රු. 739,710 ක් පමණකි. රාජ්‍ය මුදල් භාවිතා කර පිළිසකර කර දුන් පරිශ්‍ර මනා ලෙස නඩත්තු කිරීම හා ආරක්ෂා කිරීම අදාල ආයතනය මගින් සිදු කල යුතු ය. ජලය බැස යාමට සකස් කර තිබූ කාණුව ඉතාමත් හොඳ නිමාවකින් සකස් කර ඇති බව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් දන්වා ඇත. concrete slab මත cement rendering ඉරි තලා ඇති බැවින් ඒවා නැවත සිමෙන්ති දමා එම, ස්ථාන නඩත්තු කාලය තුළ පිළිසකර කිරීමට කොන්ත්‍රාත්කරු දැනුවත් කර ඇත. කොන්ත්‍රාත්කරු විසින් අඩුපාඩු | ඉදිකිරීම් නිසි නිමාවකින් හා කල් පැවැත්මකින් යුතුව සිදු කරන බවට මනා අධීක්ෂණයක් සිදු කළ යුතුය. |

| | | |
|---|---|---|
| වියදම් කල මුදලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කර නොතිබුණි. | සකස් නොකරන්නේ නම් රඳවුම් මුදලින් විකල්ප ක්‍රියාමාර්ගයක් මඟින් පිළිසකර කර ගැනීමට කටයුතු කරන බව. | |

**1.5.5.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වෙන්නප්පුව ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලය 1990 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා කුලී පදනම මත ලබාගත් ගොඩනැගිලි වල පවත්වාගෙන යනු ලබන අතර 2021 වර්ෂයේ සිට 2025 දක්වා බදු කුලී වශයෙන් රු.5,712,000 ක් බාහිර පාර්ශව වෙත ගෙවා තිබුණි. 2009 වර්ෂයේදී ප්‍රාදේශිය ලේකම් කාර්යාලය වෙතින් ප්‍රාදේශිය ඉංජිනේරු කාර්යාලය වෙත ඉඩම් කොටසක් ලබා දී තිබුණද කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරිමට කටයුතු නොකිරිම මත එකී ඉඩමද වර්ෂ 16 ක පමණ කාලයක සිට නිශ්කාර්යව පැවතුණි. | ගොඩනැගිල්ලක් ඉදිකර ගැනීම සඳහා ඉඩමක් දෙපාර්තමේන්තුව සතුව පවතින බැවින් ගොඩනැගිල්ල ඉදිකර ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන ලබාදෙන ලෙස කිහිප වරක් ඉල්ලීම් කර ඇති නමුදු මෙතෙක් ඒ සඳහා ප්‍රතිපාදන ලැබී නොමැත. එසේ ගොඩනැගිලි ඉදිකිරීම සඳහාම වෙන්වූ ප්‍රතිපාදන සංරචකයක් දෙපාර්තමේන්තුවට නොමැති අතර , වාර්ෂිකව ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන ඉල්ලුම් කළද උපමාන පාදන ප්‍රදාන වලින් වෙන්වන ප්‍රතිපාදන පමණක් ලැබේ. වෙන්නප්පුව ප්‍රා.ඉ.කා. ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලබා ගැනීමට 2026 වර්ෂයේ මූල්‍ය ඇස්තමේන්තුවටද ඇතුලත් කර ඇති බව. | ලබා දී ඇති ඉඩම් කොටස් ඵලදායී ලෙස භාවිතා කරමින් කාර්යාල පරිශ්‍ර ඉදිකර ගැනීමට ප්‍රතිපාදන වෙන්කරවා ගත යුතුය. |

## 1.5.6 ශීර්ෂය 213 - වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### 1.5.6.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| (i) xv පරිච්ඡේදය 9 වැනි පරිශිෂ්ටය | වැටුප් රහිත නිවාඩු මත නිලධාරීන්ගේ විදේශගත ගිවිසුමේ කාලය අවසන් වුවද, නැවත සේවයට වාර්තා නොකළහොත් ගිවිසුමේ පරිදි අයවිය යුතු මුදල ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් ආණ්ඩුවට ගෙවිය යුතු වුවද, ගිරිඋල්ල හා මහව කලාප අධ්‍යාපන කාර්යාලවලට අනුයුක්ත ව සේවය කළ ශ්‍රී ලංකා ගුරුසේවයේ නිලධාරීන් 7 දෙනෙකු විදේශ නිවාඩු අවසන් කර නැවත සේවයට වාර්තා කර නොතිබුණි. ගිවිසුමේ (2) (iv) වගන්තිය ප්‍රකාරව එම නිලධාරීන්ගෙන් අය විය යුතු රු.6,161,174 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අය කරගෙන නොතිබුණි. | ගිරිඋල්ල කලාපයේ ගුරුවරු 05 දෙනා සහ මහව කලාපයේ ගුරුවරුන් දෙදෙනෙකු වෙත සේවය හැරයාමේ සහ දණ්ඩන මුදල් අය කර ගැනීමේ නිවේදන නිකුත් කර ඇත.මහව කලාපයේ ඩබ්.ඒ.සුනේත්‍රා ලියනගේ මිය නැවත සේවයේ පිහිටුවීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කර ඇති බව. | ආයතන සංග්‍රහය ප්‍රකාරව අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ii) 2019 පෙබරවාරි 25 දිනැති අංක 05/2019 දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛය | පහ ශ්‍රේණි ශිෂ්‍යාධාර ගෙවීම් මාර්ග ගත වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී පාසල මඟින් සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය තොරතුරු පද්ධතියේ නිරවද්‍යතාව තහවුරු කර ගෙවීම් කටයුතු සඳහා බැංකු ශාඛා වෙත සෑම මසකම 29 දිනට පෙර යොමු කිරීම කලාප අධ්‍යාපන කාර්යාලයේ කාර්යයක් වුවද, ශිෂ්‍යත්වලාභීන්ගේ තොරතුරු | මෙම මුදල් ශිෂ්‍යාධාර සිසුන්ගේ ගිණුම් වලට බැර කිරීමේ ප්‍රමාදය අවම කර ගැනීමට කලාප මට්ටමින් ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් සියලු පාසල් වල ශිෂ්‍යාධාර ගිණුම් වලට බැර නොවූ සිසුන්ගේ තොරතුරු රැස් කර මහජන බැංකුවේ කළමනාකරු වෙත ඉදිරිපත් කර නිරවුල් කර ගැනීමට කටයුතු කරන ලෙස සියලුම කලාප | හැකි සෑම උත්සාහයක්ම දරා ප්‍රතිලාභ සිසුන්ට නිසි ආකාරව ලබා දීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | නිවැරදි නොවීම තුළ කලාප අධ්‍යාපන කාර්යාල 06 ක 2023 අප්‍රේල් මාසයේ සිට 2025 ජූනි මස දක්වා ගෙවිය යුතු ශිෂ්‍යාධාර රු.2,427,250 ක් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණු අතර 2021 සැප්තැම්බර් මස සිට 2023 සැප්තැම්බර් මස දක්වා රු.1,876,503 ක මුදලක් රාජ්‍ය ආදායමට බැරකර තිබුණි. | අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් දැනුම්වත් කර ඇති බව. |

**1.5.6.2 පාඩු හා හානි**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වෙන්නප්පුව ශුද්ධ වූ පවුලේ බාලිකා මහා විද්‍යාලයේ 2024 වර්ෂයේ පාසල් සංවර්ධන සැලැස්මෙන් අනුමත වී තිබූ සංගීත ප්‍රසංගයේ සමරු කලාපයට ඒ ඒ ශ්‍රේණි මට්ටමින් රු.5,023,050ක මුදලක්ද, අනුග්‍රාහක දායකත්වය හා පරිත්‍යාග ලෙස රු.1,355,000ක මුදලක්ද ලැබී තිබුණද, එම මුදල් පාසල් සංවර්ධන සමිති නිල බැංකු ගිණුමට බැරකර නොතිබුණි. | පාසල තුළ සිදු කරන ඕනෑම ව්‍යාපෘතියක් 54/2023 චක්‍රලේඛයට අනුගත වෙමින් සිදු කළ යුතු බව විදුහල්පති වෙත අවධාරණය කර ඇති බව. | ආදායම් පාසල් සංවර්ධන සමිති ගිණුමට බැරකර වියදම් දැරීමට කටයුතු කළ යුතුය. |

**1.5.6.3 කළමනාකරණ දුර්වලතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අයත් කලාප කාර්යාල 08 ට අයත් වූ පාසල් 1204 කින් පාසල් 1043 ක භූමියේ ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට 2025 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගෙන ඇති පාසල් සංඛ්‍යාව 161 ක් බව. | ඉඩම්වල මැනුම් සිදු කර පැවරුම් නියෝග ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | වයඹ පළාතේ තොරතුරු හා දුරස්ථ අධ්‍යාපන කේන්ද්‍රස්ථාන 09 හි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම ගිණුම්වල රු.6,568,279 ක ශේෂ ද, මධ්‍යස්ථාන 04 කට අදාළව රු.2,917,083 ක ස්ථාවර තැන්පතු ශේෂ ද පැවතුණි. නමුත් එම ස්ථාවර තැන්පතුවලට අදාළ පොළී ආදායම් ජංගම ගිණුම්වලට බැරවන බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | මෙම පොළී ආදායම එම මධ්‍යස්ථාන වල අවශ්‍යතාවය මත සහ කමිටු වල තීරණ මත ක්‍රියාත්මක බව. | චක්‍රලේඛ ප්‍රකාරව උපයෝජනය කිරීමටත්, වඩාත් වාසිදායක පොළී අනුපාත යටතේ ආයෝජනය කිරීමටත් කටයුතු කළ යුතුය. |

### 1.5.6.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සභාවේ කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ xviii වැනි පරිච්ඡේදයේ 192 වගන්තිය ප්‍රකාරව වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ සෑම නිලධාරියෙකුම හා වයඹ පළාත් සභාවට අන්තර්ග්‍රහනය කරනු ලැබූ සෑම නිලධාරියෙකුම ස්ථාන මාරු කිරීම් වලට යටත් වුවද, වයඹ පළාත් සභාවට අනුයුක්ත කරන ලද අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව කලාප අධ්‍යාපන කාර්යාල 06 කට අනුයුක්ත නිලධාරීන් 35 ක් වසර 06 ත් වසර 18 අතර, කාලයක් එකම සේවා ස්ථානයක සේවය කිරීමට අවස්ථාව ලබා දී තිබුණි. එමෙන්ම 195 වගන්තියේ සඳහන් පරිදි වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක නොවීම තුළ 194 වගන්තියෙන් අපේක්ෂිත iii,vi,vii,viii අරමුණු සපුරා ගැනීමට නොහැකි වී තිබුණි. | ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමේ බලධරයා වන වයඹ ප්‍රධාන ලේකම් විසින් ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.7 ශීර්ෂය - 221 වයඹ පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

#### 1.5.7.1 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වෙළඳ වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය මඟින් සුළු හා මධ්‍ය පරිමාණ වී මොල් හිමියන් සඳහා ණය ලබාදීමේ වැඩසටහන යටතේ 2023 නොවැම්බර් 01 සිට 2024 මාර්තු 20 කාලසීමාව තුල පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින් සමුපකාර සමිතිය වෙත අදියර 04 ක් යටතේ රු.මිලියන 82 ක් හා කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය වෙත අදියර 6 ක් යටතේ රු.මිලියන 69 ක් ලබාදි තිබූ අතර, 2026 මාර්තු 05 දින වන විට පුත්තලම හා කුරුණෑගල සමිති දෙකෙන් හිඟව පැවති මුදල පිළිවෙලින් රු.මිලියන 71.53 හා රු.මිලියන 69 ක් වශයෙන් එකතුව රු.මිලියන 140.53 ක් විය. ඊට අමතරව ණය ගෙවීම ප්‍රමාදය සඳහා ප්‍රමාද ගාස්තු ලෙස කුරුණෑගල සහ පුත්තලම සමුපකාර සමිති පිළිවෙලින් රු.මිලියන 16.33 ක් හා රු.මිලියන 4.47 ක් වශයෙන් එකතුව රු.මිලියන 20.8 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | සීමාසහිත කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය වෙත ලබා දුන් රු.මිලියන 69 ට අදාලව 2025 දෙසැම්බර් වාරිකය වන රු.1,150,000 ක මුදල සමිතිය වෙත අය වී ඇත. එමෙන්ම සීමාසහිත පුත්තලම දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිතිය වෙත ලබා දී ඇති රු.මිලියන 82 වෙනුවෙන් එකඟ වූ පරිදි 2025 දෙසැම්බර් හා 2026 ජනවාරි, පෙබරවාරි වාරිකය රු.3,700,002 ක මුදලක් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුමේ තැන්පත් කර ඇති අතර, පොදු තැම්පත් ගිණුමේ මේ වන විට ආහාර කොමසාරිස්ගේ උපදෙස් ලැබෙන තෙක් රඳවා ඇත. සී/ස කුරුණෑගල දිස්ත්‍රික් සහල් නිෂ්.සමු.සමිතිය විසින් ජනවාරි මාසයට අදාළ වාරිකය 2026 පෙබරවාරි 15 දින වන විටත් පියවා නොමැති හෙයින් සමිතියේ ගරු අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වෙත ගොස් සමිති භාර නිලධාරි විසින් අවශ්‍ය දැනුවත් කිරීම් සිදුකර ඇත. මීට අමතරව සමිති දෙකෙහිම සාමාජිකයින් වෙත මුදල් ගෙවීම සඳහා කඩිනමින් කටයුතු කරන ලෙස දැනුවත් කර ඇති බව. | ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතුය. |

#### 1.5.7.2 මතභේදයට තුඩුදුන් කරුණු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමුපකාර සමිති තුල පවතින ආරවුල් බේරුම් කිරීම, තිරක තීන්දු, උසාවි බලගැන්වීම, ලැබෙන උසාවි | උසාවි බලගැන්වීමෙන් පසු විවෘත අධිකරණයේ පෙනී සිටීම හා එම තීරක තීන්දු වලට අදාල තොරතුරු | දිරිදීමනා ගෙවීමට පළාත් සභාවේ විධිමත් අනුමැතියත් ලබා ගත |

| | | |
|---|---|---|
| දඩ මුදල් අදාල සමිති වෙත ගෙවා නිමකිරීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සතු කාර්යභාරයකි. මෙවැනි කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර චක්‍රලේඛ 02/2001 හා 12/2019 තුලින් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත 2022 සිට 2025 ජූලි දක්වා රු.19,528,056 ක මුදලක් දිරිදීමනා ලෙස බෙදාගෙන තිබුණි. මේ සඳහා නීතිමය ප්‍රතිපාදනයක් හෝ පළාත් සභාවේ විධිමත් අනුමැතියක් නොතිබුණි. | රැස් කිරීම හා උසාවි දඩ මුදල් දෙපාර්තමේන්තුව වෙත ලද පසු සමිති වෙත මුදල් නිදහස් කිරීම් කටයුතු ආදි සියලු කටයුතු උසාවි නිලධාරියා විසින්ම සිදු කරන බැවින් 2001 වර්ෂයේ සිට චක්‍රලේඛය නිකුත් කිරීමෙන් පසු මෙම දිරි දීමනා ගෙවීම සිදු කරනු ලබයි. 2001 පෙබරවාරි 15 දිනැති අංක 02/2001 හා 2019 අගෝස්තු 07 දිනැති අංක 12/2019 දරන අභ්‍යන්තර චක්‍රලේඛය පරිදි මෙම දිරි දීමනාව ගෙවීම සිදු කර ඇත. අභ්‍යන්තර චක්‍රලේඛ සම්බන්ධයෙන් පළාත් ආණ්ඩුකාරතුමාගේ හා පළාත් ප්‍රධාන ලේකම්ගේ විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව. | යුතුය. |

## 1.5.8 ශීර්ෂය -230 වයඹ පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු පිළිබඳ පළාත් අමාත්‍යවරයා

### 1.5.8.1 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII පරිච්ඡේදයේ 13.2 වගන්තිය | සෑම මූලික විමර්ශනයක්ම නොපමාව නිම කිරීමට වගබලා ගත යුතු වුවද, මූලික විමර්ශන සඳහා බලය පවරා 2026 අප්‍රේල් 30 දිනට වසර 03 යි මාස 06 සිට වසර 01 මාස 03 දක්වා කාලයක් මූලික විමර්ශන වාර්තාව ලබා දීම සඳහා ගත කර තිබූ විමර්ශන 12 ක් තිබුණි. | මූලික විමර්ෂන කමිටුවේ අධික කාර්ය බහුලත්වය හේතුවෙන් මෙම මූලික විමර්ශනය නිම කිරීම ප්‍රමාද වී ඇත. එම කටයුතු කඩිනමින් අවසන් කරන ලෙස උපදෙස් ලබා ඇති බව. | ආයතන සංග්‍රහය පරිදි කටයුතු කළ යුතුය. |

### 1.5.9 ශීර්ෂය 231 - වයඹ පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

### 1.5.9.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | වයඹ පළාත් කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ I වන කාණ්ඩය XV පරිච්ඡේදයේ 214 වන වගන්තිය ප්‍රකාරව හා 173 වැනි වගන්තිය | තනතුර අතහැර ගියාසේ සලකන ලද නිලධාරීන් 12 දෙනෙකු වෙත වැඩිපුර ගෙවන ලද රු.545,855 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. තනතුර අතහැර ගියා සේ සලකන ලද තවත් නිලධාරීන් 14 ක් වෙත වැඩිපුර ගෙවන ලද මුදල් පිළිබඳව විගණනයට තහවුරු කර ගැනීමට සාක්ෂි ඉදිරිපත් නොවීය. | විගණන විමසුම සඳහා පිළිතුරු ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් ලැබී නොමැති හෙයින් ඒ සඳහා පිළිතුරු කඩිනමින් ලබා ගෙන ඔබ වෙත ඉදිරිපත් කරන බව. | තනතුර අතහැර ගිය නිලධාරීන්ගෙන් වැඩිපුර ගෙවන ලද මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | වයඹ පළාත් මුල්‍ය රීති සංග්‍රහයේ 466 හා 477 වන රීති | කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 173 ක් අතුරින් 62 ක, පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 64 අතරින් 41 ක 2025 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු 2026 ජූනි 30 වන විට ද, අවසන් කර නොතිබුණ අතර පුත්තලම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් ආයතන 05 ක 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ කටයුතු ද අවසන් කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | පළාත් මුල්‍ය රීති අනුව භාණ්ඩ සමීක්ෂණ නිමකිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.9.2 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආපනශාලා අරමුදල වෙනුවෙන් 2024 වර්ෂයේ රෝහල් 15 කින් හා 2025 වර්ෂයේදී රෝහල් 21 කින්, පිළිවෙලින් රු.9,003,357 ක් හා රු.28,417,499 ක මුදලක් ලැබී තිබුණ ද, ආපනශාලා අරමුදලින් රෝහල් කටයුතු සඳහා වන වියදම් වෙනුවෙන් ගෙවීම් සිදුකර තිබුණේ 2024 වර්ෂයේ රෝහල් 06 ක් හා 2025 වර්ෂයේ රෝහල් 06 ක් සඳහා පිළිවෙලින් රු.10,865,826 හා රු.11,489,936 පමණි. ආපනශාලා අරමුදලෙහි 2025 දෙසැම්බර් 31 දිනට රු.54,214,745 ක ශේෂයක් රෝහල් කටයුතු වෙනුවෙන් වැය කර නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | ආපනශාලා අරමුදලේ මුදල් රෝහල් කටයුතු සඳහා වැය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2006 අංක 21 දරන පෞද්ගලික වෛද්‍ය ආයතන (ලියාපදිංචි කිරීමේ) පනත යටතේ පෞද්ගලික වෛද්‍ය ආයතන 2024 හා 2025 වර්ෂවලදී පිළිවෙලින් 238 හා 371ක් ලියාපදිංචි වී තිබුණු අතර, වයඹ පළාත් සභාව වෙත 2024 හා 2025 වර්ෂ වලදී ලියාපදිංචි ගාස්තු අදායම වශයෙන් එකතුව රු.12,555,490 ක් ලැබී තිබුණද දීර්ඝ කාලීනව මෙම අරමුදලෙහි මුදල් භාවිතයට ගෙන නොතිබුණ අතර පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදිංචි කිරීමේ කටයුතු සඳහා වන අවශ්‍යතා සඳහා හෝ යොදාගෙන නොතිබුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | මෙම අරමුදල් පෞද්ගලික වෛද්‍ය ආයතන ලියාපදංචියට අවශ්‍ය කටයුතු සඳහා හෝ යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.9.3 වාහන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අංක LW-1790 දරන ගිලන්රථය සමාලෝචිත වර්ෂයේ අවසානයට අනතුරට ලක් වී වසර 05 ක් ගත වී තිබුණද, ගිලන් රථයේ අලුත්වැඩියාව අවසන් කර නොතිබුණු අතර කිසිදු අනුමැතියකින් තොරව ලක්ෂ 50 ක මුදලක් තාක්ෂණික වාර්තාවක් නොමැතිව ගෙවා තිබුණ ද, අලුත්වැඩියාව අවසන් කර නොතිබීම හේතුවෙන් ධාවන තත්ත්වයේ නොතිබුණි. රියදුරු සේවයෙන් පහකර තිබුණද රක්ෂණයෙන් ගෙවීම ප්‍රතික්ශේප කළ අනතුරෙහි අලාභය රු.11,705,970 මුදල වගකිවයුතු පාර්ශවයන්ගෙන් අයකර නොතිබුණි. | අංක LW-1790 දරන ගිලන් රථයහි අවසන් කලයුතු අලුත්වැඩියා සඳහා නැවත අදාල ආයතනය වෙත යොමු කර ඇති අතර, අනතුරෙහි අලාභය අය කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට දන්වා ඇති බව. | ගිලන්රථයෙහි අලුත්වැඩියාව අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර, රජයට සිදු වී ඇති අලාභය අයකර ගැනීමට ද කටයුතු කළ යුතුය. |
| (ආ) | කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයට අයත් PE-4736 දරන කැබ් රථය 2021 සැප්තැම්බර් 09 අනතුරට ලක්වී වසර 04 ක් ගතවී තිබුණද අලුත්වැඩියාව අවසන් කර නොතිබුණු අතර රියදුරු 2025 අප්‍රේල් 16 නැවත සේවයේ පිහිටුවා තිබුණ ද, විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා නොතිබුණි. | අංක PE-4736 දරන කැබ් රථය ටොයෝටා ලංකා ආයතනයෙන් අලුත්වැඩියා සිදුකිරීමට අනුමැතිය ලැබී ඇති අතර රක්ෂණයෙන් ප්‍රතිපූර්ණ වටිනාකම ගෙවීමට එකඟ වී ඇත. රියදුරු විධිමත් විනය පරීක්ෂණයකට යටත්ව සේවයේ නොසිටි කාලය වෙනුවෙන් හිඟ වැටුප් ගෙවීමකින් තොරව, සෞඛ්‍ය කාර්ය සහායක (සාමාන්‍ය) තනතුරෙහි නැවත සේවයේ පිහිටුවා ඇති බව. | අලුත්වැඩියාව අවසන් කිරීමට කටයුතු කළ යුතු අතර, විනය පරීක්ෂණය පවත්වා කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.9.4 නිෂ්ක්‍රිය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 මාර්තු සිට ගාස්තු අය කරමින් කුරුණෑගල සෞඛ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ ගොඩනැගිල්ලක පවත්වාගෙන යන ලද සුවතා පියස ශරීර සුවතා මධ්‍යස්ථානය 2025 | වයඹ පළාත් ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තු වෙත සුවතා පියස මධ්‍යස්ථානය සතියේ සෑම බ්‍රහස්පතින්දා දිනකම පුහුණු කරුව න් පුහුණු කිරීමේ වැඩ සටහන | සුවතා පියස නිශ්කාර්යව පැවතීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අප්‍රේල් 29 දින සිට වසා දැමීම හේතුවෙන් එදින සිට අඩි 91.5 හා පළල අඩි 31 ක් වූ ශරීර සුවතා මධ්‍යස්ථාන ගොඩනැගිල්ල හා එහි උපකරණ නිෂ්කාර්යව පැවතීමෙන් එම මධ්‍යස්ථානය ස්ථාපිත කිරීමේ අරමුණ ඉටු වී නොතිබුණි. | සඳහා ලබා දී ඇත. වර්තමානය වන විට වසා දමා ඇති සුවතා පියස ශරීර සුවතා මධ්‍යස්ථානය නැවත ආරම්භ කිරීම සම්බන්ධ පරීක්ෂා කර වාර්තා කිරීමට නිලධාරීන් 07 දෙනකුගෙන් සමන්විත කමිටුවක් පත්කර ඇති බව. | |

**1.5.9.5 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2025 වර්ෂයට අදාළව පුත්තලම හා කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාල යටතේ පවතින සෞඛ්‍ය ආයතනයන්හි කල් ඉකුත් වූ ඖෂධ වල වටිනාකම රු.2,324,885 ක් විය. ඉකුත් වර්ෂයේ කල් ඉකුත් වූ ඖෂධ වල වටිනාකම රු.873,597 වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.1,451,288 ක හෙවත් සියයට 166 කින් කල් ඉකුත් වූ ඖෂධ වල වර්ධනනයක් නිරීක්ෂණය විය. | 2024 වර්ෂයට සාපේක්ෂව 2025 වර්ෂය තුළ කල් ඉකුත් වූ ඖෂධ වටිනාකම වැඩි වී ඇත්තේ ඖෂධ ප්‍රමාණයන්හි වැඩි වීමක් නිසා නොවන අතර, අදාල කල් ඉකුත් වූ ඖෂධවල ඒකක මිල වැඩිවීම හේතු වී ඇත. කල් ඉකුත් වී ඇති ඖෂධ කල් ඉකුත්වීමට නව ආදේශක ඖෂධ භාවිතයද හේතු වී ඇත. එවැනි භාවිතයන් කලින්හඳුනා ගැනීමට නොහැකි අතර, ඇස්තමේන්තු කිරීමෙන් පසුව ප්‍රායෝගිකව මතුවන තත්වයක් බව. | ඖෂධ කල්ඉකුත්වීමට පෙර අවශ්‍ය ආයතන වෙත ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග කඩිනමින් ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2025 වර්ෂයට අදාළව පුත්තලම හා කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය යටතේ පවතින සෞඛ්‍ය ආයතනයන්හි තත්ත්වයෙන් අසමත් ඖෂධ වල වටිනාකම රු.2,341,225 ක් විය. එය 2024 වර්ෂයේ රු.268,624ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.2,072,631 කින් හෙවත් සියයට 771 ක වර්ධනයක් නිරීක්ෂණය විය. | ඖෂධ බෙදා හැරීම කොළඹ වෛද්‍ය සැපයුම් අංශය මගින් සිදුවන අතර, ගබඩා වෙත නිකුත් කරන ඖෂධ භාවිතයට නුසුදුසු බවට වෛද්‍ය සැපයුම් අංශය මගින් විවිධ අවස්ථාවන්හි නිකුත් කරන චක්‍රලේඛ අනුව තීරණය වේ. එම තත්ත්වය දිස්ත්‍රික්කය තුළ සෞඛ්‍ය ආයතනවලට පාලනය කළ නොහැකි බව. | අපහරණ කටයුතු කඩනම් කළ යුතුය. |
| (ඇ) | කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 130 කදී රු.35,839,564 ක් වටිනා ඖෂධ වර්ග 130 ක් දේශීය මිලදී ගැනීම් | විගණන විමසුම් වලට අදාලව පිළිතුරු කුරුණෑගල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙතින් ලැබී නොමැති හෙයින් ඒ සඳහා පිළිතුරු කඩිනමින් ලබා ගෙන ඔබ | ස්වස්ථා පද්ධතිය තුළින්ම මිලදී ගැනීම් හා බෙදාහැරීම් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| කර තිබුණි. ස්වස්ථා පද්ධතිය භාවිතා කර ඇණවුම ඉදිරිපත් කිරීම පමණක් සිදුකර මිලදී ගැනීම හා බෙදා හැරීම ස්වස්ථා පද්ධතිය ඇතුළත් නොකර පද්ධතියට බාහිරව manual ක්‍රියාත්මක කර තිබුණි. | වෙත ඉදිරිපත් කරන බව. | |

**1.5.10 ශීර්ෂය 232 - වයඹ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

**1.5.10.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| හොරොම්බුව මධ්‍යම බෙහෙත් ශාලාවේ සේවය කර නොදන්වා සේවයට නොපැමිණි නිලධාරියෙකු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ V පරිච්ඡේදයේ 07 වන වගන්තිය අනුව කටයුතු කර නොතිබුණු අතර සේවයට වාර්තා නොකළ කාලයට අදාළව 2025 මාර්තු සිට අගෝස්තු දක්වා දළ වැටුප් ලෙස රු.729,045ක් ගෙවා තිබුණි. | අදාළ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීහට තනතුර අතහැර යාමේ නිවේදනය නිකුත් කර ඇති අතර 2025 පෙබරවාරි සිට අගෝස්තු දක්වා ගෙවන ලද වැටුප අයකර ගැනීම සම්බන්ධයෙන් 2025 ඔක්තෝබර් 02 දිනැති මගේ අංක ව/ ආයු කො/ආ 12/විමර්ශන/2025 දරන ලිපිය මගින් කඩ ඉම් මගින් රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් වෙත යොමුකර ඇති බව. | ආයතන සංග්‍රහට අනුව කටයුතු කළ යුතු අතර සේවය නොකරන ලද කාලයට ගෙවන ලද වැටුප් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. නිලධාරීන් සේවයට නොපැමිණීම ඉක්මනින් වාර්තා වන පරිදි අභ්‍යන්තර පාලන ක්‍රමවේදය සකස් කර ගත යුතුය. |

**1.5.11 ශීර්ෂය -233 වයඹ පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව**

**1.5.11.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2024 අප්‍රේල් 28 දිනැති අංක ED/03/38/11/01 (II) දරන අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේ 06/2021 චක්‍රලේඛය | විශේෂ අවශ්‍යතා සහිත දරුවන් පස්දෙනෙකු සඳහා එක් ගුරුවරයෙකු සිටිය යුතු බව දක්වා තිබුණද, පළාත තුළ පවතින විශේෂ අවශ්‍යතා සහිත දරුවන්ගේ නිපුණතා සංවර්ධන මධ්‍යස්ථාන 21 ක් සඳහා | විශේෂ අධ්‍යාපන උපදේශක තනතුරු පුරප්පාඩු සඳහා කොන්ත්‍රාත් පදනම් මත බඳවා ගැනීමට කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇති බැවින් වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා යවා ඇත. එසේම | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | මුළු උපදේශිකාවන් ප්‍රමාණය 39 ක් හා අධ්‍යාපනය ලබන සිසුන් ප්‍රමාණය 458 ක් වූයෙන් එම අවශ්‍යතාව සම්පූර්ණ වී නොතිබුණි. | උපදේශක තනතුරු 12 ක් සඳහා ස්ථිර පදනමින් බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර ප්‍රධාන ලේකම් වෙත අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | |

**1.5.11.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වැඩිහිටි නිවාස 05 ක බැංකු ගිණුම් 05 ක 2025 දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,772,304 ක මුදලක් වැඩිහිටියන්ගේ සුභසාධනය වෙනුවෙන් වියදම් නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි. | සෞඛ්‍ය අරමුදල ගිණුම සම්බන්ධයෙන් කටයුතු කරන ආකාරය සම්බන්ධව 2026 මාර්තු 09 දිනැති අංක NWP/SSD/DEV/11/Common/1 දරන ලිපියෙන් සියලුම වැඩිහිටි නිවාසවල පාලක මණ්ඩල දැනුවත් කර ඇති බව. | සෞඛ්‍ය අරමුදලෙහි මුදල් වැඩිහිටි සුභසාධනයට යෙදවීමට කටයුතු කළ යුතුය. |

**1.5.12 ශීර්ෂය - 234 වයඹ පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**1.5.12.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය | වැඩ බැලීමේ පත් කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් පමණක් වුවත්, පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ ධීවර අංශයේ ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III/II ශ්‍රේණියේ තනතුරක් වන සහකාර/නියෝජ්‍ය අධ්‍යක්ෂ තනතුර වසර 14 ක සිට පුරප්පාඩුව පවතින අතර, 2026 මාර්තු 31 දින වන විටත් පුරප්පාඩුව පිරවීමට කටයුතු නොකර සංවර්ධන නිලධාරියෙකු වැඩ බැලීම සඳහා පත්කර තිබුණි. | වයඹ ප්‍රධාන ලේකම්ගේ 2026 මාර්තු 20 දිනැති අංක NWP/CS/AD/11/10/37 දරන ලිපියෙන් ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරී තනතුරු 02 ඇතුළුව තවත් තනතුරු 12 ක බඳවා ගැනීමේ ඉදිරි කටයුතු සිදු කිරීම සඳහා අදාල තොරතුරු කැඳවා ඇති අතර ඒ සඳහා 2026 මාර්තු 29 දිනැති අංක NWP/DPCS/ADM/04/05 දරන ලිපියෙන් අදාළ තොරතුරු ඉදිරිපත් කර ඇති බව. | පුරප්පාඩු සපුරා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.12.2 කළමනාකරණ දුර්වලතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිවාස හා ළමා රක්ෂක දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා 85 KVA ධාරිතාවෙන් යුතු ජෙනරේටරයක් මිලදි ගැනීම සඳහා වෙළඳපොල මිල සැඳහුම් ක්‍රමය යටතේ මිල ගණන් කැඳවා 100 KVA ධාරිතාවයෙන් යුතු ජෙනරේටරයක් 2025 මැයි 29 දින මිලදී ගෙන තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය (2006) හි 3.4 වගන්තිය අනුව වටිනාකමින් අඩු වහාම ලබා ගත හැකි භාණ්ඩ වෙළඳපල මිල සැඳහුම් ක්‍රමය අනුගමනය කරමින් මිලදී ගත යුතු වුවත් ඊට පටහැනිව යමින් රු.6,595,610 ක් වැය කර ජෙනරේටරය මිලදී ගෙන තිබුණි. | ජෙනරේටර් යන්ත්‍රයක් මිලදී ගැනීමට අදාල ව්‍යාපෘතිය අනුමත වී ඇත්තේ 2024 වර්ෂයේ නොවැම්බර් වේ. ඊට අදාල සියලු කටයුතු සිදු කර විවෘත මිල කැඳවීම එම ව්‍යාපෘතිය සිදු කර අවසන් කිරීමට නොහැකි බැවින් යන්ත්‍රය මිලදී ගැනීමට කටයුතු කර ඇති බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය. |

### 1.5.13 ශීර්ෂය 241 - වයඹ පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1.5.13.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII වැනි පරිච්ජේදයේ 3.1 හා 4.2 ඡේද | අතිකාල වැඩ සඳහා මුදල් වැයකල යුත්තේ අදාල කටයුතු ඉටු කිරීමට අන් කිසිම මාර්ගයක් නැති අවස්ථාවලදී සහ අතිකාල දීමනා ගෙවිය හැක්කේ නිශ්චිත වශයෙන් නියම කරන ලද්දා වු සාමාන්‍ය වැඩකටයුතු වලින් ඒකාන්තයෙන්ම බැහැරවු හදිසි, සාමාන්‍ය කාර්යාල වේලාව තුල ඉටුකර | 2025 වර්ෂයේ වෙන් වී තිබූ ප්‍රතිපාදන මත 2025 දෙසැම්බර් 31 දිනට නියමිත පරිදි වැඩ විෂයයන් ඉටුකිරීමට ප්‍රමාණවත් නිලධාරීන් දෙපාර්තමේන්තුව තුල රාජකාරි කටයුතු වල යෙදී නොසිටි බැවින් පළාත් සභාව විසින් මෙම තීරණය ලබාගෙන තිබූ අතර, ඒ අනුව කටයුතු කරමින් සත්‍ය වශයෙන් සිදුකල රාජකාරි කටයුතු අනුව ලබාදී තිබූ අදාල සීමාවන් තුල ගෙවීම් | ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නොහැකි වැඩ සඳහා සහ යම් කාර්යාලයක සීමාවලින් පිටත පිහිටි වැඩ බිම්වලට නිතිපතා යායුතු අධීක්ෂණ ස්වාභාවය රාජකාරි පැවරී ඇති නිලධාරින්ට අතිකාල ගෙවීමට හිමිකම් නොමැති බව දක්වා තිබියදී ඊට පටහැනිව 2025 නොවැම්බර් 25 දිනැති ප්‍රධාන ලේකම්ගේ අංක NWP/CS/AD/15/1/1 2025 දරන ලිපිය මගින් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය සහිතව ඉංජිනේරු, ප්‍රමාණ සමීක්ෂණ, වාස්තු විද්‍යාඥ කාර්මික නිලධාරි, සැලසුම් ශිල්පි යන තනතුරු සඳහා අතිකාල දීමනා ගෙවීමට අනුමැතිය ලබාදී තිබූ අතර ඒ අනුව සමාලෝචිත වර්ෂයේ මාස 3 ක කාලසීමාවක් සඳහා මාර්ග දෙපාර්තමේන්තුව විසින් නිලධාරින් වෙත රු.1,314,204 ක අතිකාල දීමනා ගෙවීමට කටයුතු කර තිබුණි. | කටයුතු සිදුකල බව | |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 571(2) | මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවේ තැන්පත් කල දින සිට වර්ෂ 2 ක ඉක්මවූ රු.5,279,691 ක් වටිනා ඉකුත් තැන්පතු 22 ක් නිරවුල් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කර නොතිබුණි. | බොහොමයක් තැන්පතු වසර 2 ක් ඉක්මවා ගියද අදාල කාර්යය නිම වන තෙක් නිදහස් කළ නොහැකි බැවින් රඳවාගෙන ඇති බවත් අදාල කාර්යය නිම වූ විගස එම මුදල් නිදහස් කිරීමට කටයුතු කරන බව | මුදල් රෙගුලාසි / පළාත් මූල්‍ය රීති වලට අනුකූලව කටයුතු කල යුතු අතර ගිවිසුම් සම්බන්ධ තොරතුරු යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.13.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත 2025 වර්ෂය තුල භාණ්ඩාගාරය වෙතින් හා වෙනත් මූලාශ්‍ර වලින් රු.2,221,817,617 ක අග්‍රිම ලැබී තිබුණු අතර රු.2,014,634,025 ක වියදම් දරා තිබුණි. සැලසුම්කල පරිදි කාර්යයන් ඉටුකර ගැනීමට නොහැකි වීම මත රු.207,183,593 ක ප්‍රතිපාදන උපයෝජනය කිරීමකින් තොරව නැවත භාණ්ඩාගාරය වෙත පියවීමට කටයුතු කර තිබුණි. | වර්ෂය අවසානයේ මෙම සියළුම මුදල් සඳහා ගෙවීම් සිදු කිරීමේ අරමුණින් මෙම අක්මුදල් පළාත් භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කළ අතර ලැබුණු බිල්පත් වල අඩුපාඩු හා අපේක්ෂිත පරිදි ගෙවීම් සඳහා බිල්පත් නොලැබීම හේතුවෙන් මෙම මුදල් ඉතිරි වූ බව. | සැලසුම්කල පරිදි ප්‍රතිපාදන කාර්යක්ෂමව උපයෝජනය කිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.13.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මාර්ග නඩත්තු භාරකාර ක්‍රමය යටතේ වැඩ ඉටු කිරීමට රු.300,000,000 ක ප්‍රතිපාදන මාර්ග දෙපස කැළෑ කැපීම හා මාර්ග හානි යාවත්කාලීන කිරීම සඳහා වෙන්කර තිබුණ ද, අපේක්ෂිත පරිදි වැඩ ඉටු නොකිරීම හේතුවෙන් හා ප්‍රතිපාදන වෙනත් කාර්යයන්ට මාරු කිරීම හේතුවෙන් ප්‍රතිපාදනය රු.37,757,267 දක්වා අඩුකර තිබුණි. මාර්ග දෙපස කැලය කැපීම සඳහා 2025 වර්ෂය තුල විධායක ඉංජිනේරු කාර්යාල 06 ක මාර්ග කොටස් 825 අතරින් මාර්ග කොටස් 426 ක් සඳහා භාරකරුවන් පත්කර ගැනීමට නොහැකිව පැවතුන හෙයින් භෞතික ප්‍රගතිය සියයට 48 ක්ව පැවතුණි. | මාර්ග නඩත්තු කටයුතු වලදී Routine Maitenance යටතේ මාර්ග දෙපස කැළෑ කැපීම හා එදිනෙදා සිදුවන මාර්ග හානි යාවත්කාලීන කිරීම සිදු කරනු ලබයි. නඩත්තු භාරකරුවන් මඟින් තාක්ෂණික නොවන වැඩ කොටස් ඉටුකරවා ගැනීම නිසා අපේක්ෂිත ප්‍රතිපාදන අවශ්‍යා නොවූ අතර මාර්ග නඩත්තු භාරකරුවන්ගේ ඌනතාවය මේ සඳහා බලපා ඇති බව. | සියළු මාර්ග කොටස් සඳහා භාරකරුවන් පත්කරගැනීමට හෝ වෙනත් සුදුසු විකල්ප ක්‍රමවේදයක් භාවිතා කරමින් මාර්ග දෙපස කැළෑ කැපීම ක්‍රමානුකූලව ඉටුකිරීමට කටයුතු කල යුතුය. |

### 1.5.13.4 ව්‍යාපෘති ඉටුකිරිමේ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල, කුලියාපිටිය හා වාරියපොල විධායක ඉංජිනේරු කාර්යාල 3 හි ක්‍රියාත්මක කරන ලද රු.195,546,662 ක ව්‍යාපෘති 6 ක වැඩ ගිවිසුම්ගත කාලය තුල නිමකිරීමට කටයුතු කර නොතිබුණු අතර දින 08 සිට දින 68 දක්වා කාල ප්‍රමාදයක් සහිතව වැඩ නිමකර තිබුණි. ව්‍යාපෘති 04 ක වැඩ 2026 පෙබරවාරි 26 වන විටත් නිම කර නොතිබුණි. වැඩ ආරම්භ කිරිමට පමාවීම මත හා කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා මත ව්‍යාපෘති නියමිත කාල සීමාව තුළ ඉටුකරවා ගැනීමට නොහැකිව තිබු අතර සාධාරණ හේතුන් හා සාක්ෂි නොමැතිව දින දීර්ඝ කිරිම් ලබා දී ගිවිසුම් ගත පරිදි ප්‍රමාද ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | අදාල කොන්ත්‍රාත් ආයතන විසින් වැඩ සටහන් ඉටු කිරීමට නොහැකි වීම පිළිබඳ කරුණු ඉදිරිපත් කළ අතර එම කරුණු සලකා බලා කාලය දීර්ඝ කිරීමක් සිදුකල අතර එසේ කාලය දීර්ඝ කිරීමේ හේතු සාධාරණ නොවන අවස්ථාවල ප්‍රමාද ගාස්තු අයකර ඇති බව. | ගිවිසුමට අනුකූලව කටයුතු කල යුතුය.<br>වැඩ ආරම්භ කිරීමට පමාවීම,වර්ෂාව වැනි හේතු සඳහා පිලිගත හැකි හේතු ඉදිරිපත් කර ඇත්නම් ඒ පිලිබඳ ලොග් සටහන් පොතෙහි හා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් ලබාගත් තොරතුරු ගොනුවේ ඇතුලත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.14 ශීර්ෂය 243 - වයඹ කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

### 1.5.14.1 මතභේදයට තුඩුදුන් ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කුරුණෑගල දිස්ත්‍රික්කයේ අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වළකුඹුර ප්‍රදේශයේ වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන වළකුඹුර පේෂකර්ම මධ්‍යස්ථානය, ජනසළු අලෙවිසැල සහ අත්කම් පියස, දිස්නා මැටි පුහුණු ආයතනය පිහිටි රූඩ් 3 පර්චස් 22.9 ඉඩම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් වේ. එම ඉඩම් ප්‍රමාණය 1979 | 2025 සැප්තැම්බර් 30 දිනැතිව ඉඩම් ප්‍රතිසංස්කරණ බල මණ්ඩලයේ කුරුණෑගල වෙත අංක 1773 දරන පිඹුරු පත් සකස් කිරීමේදී රූඩ් 01 ක ප්‍රමාණය සහිත කැබලි අංක දෙක බෙදා වෙන් කර පිඹුරු පත් සකස් කර ඇති බවත්, එම පිඹුරේ අත්කම් පියස නමැති ගොඩනැගිල්ල ඇතුළත් නොවීම මත අංක 1773 දරණ පිඹුර පත නිවැරදි නොවන බව නිරීක්ෂණය වූ බවත්, ඉදිරියේදී භූමිය හා ගොඩනැගිල්ල තව දුරටත් | ඉඩමේ අයිතිය නිරවුල් කර දෙපාර්තමේන්තුව වෙත කඩිනමින් පවරා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| වර්ෂයේ සිට වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව වසර 46 කට වැඩි කාලයක් අඛණ්ඩව පරිහරණය කරමින් සිටියදී ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව විසින් වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවට දැන්වීමෙන් හා එකඟතාවය ලබාගැනීමෙන් තොරව මෙම ඉඩමෙන් පර්චස් 40 ක ඉඩම් කොටසක් 1972 අංක 1 දරන ප්‍රතිසංස්කරණ පනතේ 14 වන වගන්තිය යටතේ පවුල තුළ පැවරීම වශයෙන් සඳහන් කර බාහිර පාර්ශවයකට ලබාදීමට කටයුතු කර ඇති බව ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ අධ්‍යක්ෂකගේ 2025 සැප්තැම්බර් 25 දිනැති කො/931 දරන ලිපිය මගින් තහවුරු විය. බාහිර පාර්ශවයකට ලබාදීමට කටයුතු කර තිබූ පර්චස් 40 වර්තමාන වටිනාකම රු.මිලියන 24 කට වඩා අධික බව නිරීක්ෂණය විය. | ඵලදායිව ප්‍රයෝජනය ගත හැකි පරිදි සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා වයඹ සංවර්ධන අධිකාරිය සමඟ එකාබද්ධ වී සැලසුම් සකස් කර ඇති බැවින් හා දෙපාර්තමේන්තුව විසින් දිර්ඝ කාලයක් භුක්ති විදි රූඩ් 01 ප්‍රමාණය සහිත පිඹුරේ කැබලි අංක 02 දරන ඉඩම් කොටසද ඇතුලත් රූඩ් 03 පර්චස් 22.8 ක් වන මුළු ඉඩම් ප්‍රමාණය භුක්තිය නිරවුල් කර මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා දීමට කටයුතු සිදුකරන ලෙස ඉල්ලීම් කර ඇති බව. |

### 1.5.15 ශීර්ෂය 252 - වයඹ පළාත් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

#### 1.5.15.1 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව සතු නිල නිවාස 27 අතරින් වර්තමානය වන විට භාවිතා කර මුදල් අය කරනු ලබන්නේ නිල නිවාස 07 කින් පමණක් බවත් තක්සේරු වටිනාකම රු.46,367,918 ක් වූ නිල නිවාස 18 ක්ම වසර 02 සිට 20 කට වැඩි කාලයක් භාවිතා නොකිරීම මත අබලන්ව නිශ්කාර්යව පැවතුණි. | දෙපාර්තමේන්තුව වෙත ලැබෙන වාර්ෂික ප්‍රතිපාදන මත හා පශු වෛද්‍ය නිලධාරීන්ගේ නිල නිවාස අවශ්‍යතාවය සලකා බලමින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කරන බව. | රජය සතු දේපල විනාශවී යාමට ඉඩ නොදිය යුතු අතර, නිශ්කාර්ය සියලුම ගොඩනැගිලි උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දෙපාර්තමේන්තුව සතුව පවතින බවට 2024 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා ඇති රු.936,637,000 ක් ලෙස මුළු තක්සේරු වටිනාකම දක්වා ඇති ඉඩම් කැබලි 43 න් මුළු තක්සේරු වටිනාකම රු.441,932,500 ක් වූ ඉඩම් කැබලි 20 කම අයිතිය දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන නොතිබුණි. | දෙපාර්තමේන්තුව වෙත පවරා නොගත් රජයේ ඉඩම් සම්බන්ධව අදාල වගකිව යුතු ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති අතර දැනට එම කටයුතු සිදු කරගෙන යමින් පවතින බව. | ඉඩම් පවරා ගැනීම් කටයුතු ඉතා ඉක්මණින් සිදුකර ගැනීමට ඉහළ කළමනාකරණය මැදහත් වී කටයුතු කළ යුතුය. |

**1.5.16 ශීර්ෂය 260 - වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලය**

**1.5.16.1 ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් මූල්‍ය රීති 41 වාර්ෂික ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම යටතේ 41.1.4 රීතිය අනුව හැකිතාක් තාත්ත්වික සහ නිවැරදි ලෙස තම ඇස්තමේන්තු පිළියෙල කිරීමට ආදායම් ගණන්දීමේ නිලධාරීන් කටයුතු කළයුතු වුවද, 2025 වර්ෂය සඳහා මුල් ආදායම් ඇස්තමේන්තුව හා 2025 දෙසැම්බර් 26 දින ඉදිරිපත් කරන ලද සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව අතර වෙනස රු.3,910,805,000 ක් හෙවත් සියයට 45 ක ඉතා ඉහළ විචලනයක් විය. මෙම ඌන අස්තමේන්තුව පළාත් සභාවේ අයවැයට ඇතුලත් නොවීම මත එම ප්‍රමාණයෙන් පළාතේ ජනතාවගේ සුභසාධනය සඳහා යෙදවිය හැකි වැඩසටහන් සීමා වී තිබුණි. | ආදායම් ඇස්තමේන්තු සකස් කරනු ලබන්නේ නිශ්චිත වශයෙන්ම අයකරගතහැකි ආදායම් පදනම් කරගෙන බව. ජනතාවගේ සුභසිද්ධිය සඳහා වන අත්‍යවශ්‍ය වැඩසටහන් පරිපූරක ඇස්තමේන්තු මඟින් සකස්කර ක්‍රියාත්මක කිරීමේදී මෙම අරමුදල් යොදවා ගැනීමට බාධාවක් නොමැති බව හා රැස්කරන වර්ෂයේම විවිධ වැඩසටහන් සඳහා යොදා නොගත්තත් ඊළඟ වර්ෂ වල වැඩසටහන් සඳහා මෙම අරමුදල් භාවිතා කරනු ලබන බව. | වාර්ෂික මුදල් ප්‍රකාශයේ අපේක්ෂිත ආදායම නිවැරදිව ඇස්තමේන්තු කර ඒ සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.16.2** වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ තොරතුරු අනුව වයඹ පළාත් සභාවේ තනතුරු නාමයන් යටතේ ලියාපදිංචි කර ඇති වාහන 45 ක්, පළාත් සභාව යටතේ පවතින ආයතනවල නොමැති අතර ඒ තුළ අපහරණය කරන ලද වාහන ද පවතින බවට තොරතුරු ඉදිරිපත් වුවද, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී අදාළ ලේඛන යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි. | වයඹ මෝටර් රථ දෙපාර්තමේන්තුවේ දත්ත පද්ධතියෙන් ඉවත් කිරීම සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් විමසා ඒ අනුව ඉදිරි කටයුතු කරමින් සිටින බව. | භෞතිකව නොමැති වාහන සම්බන්ධයෙන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධ වී සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.17 ශීර්ෂය - 261 වයඹ පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව**

**1.5.17.1** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 31 දිනට පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරි තනතුරේ පුරප්පාඩු 20 ක් පැවතුණි. | මෙම දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරි තනතුර සඳහා නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා 2022 නොවැම්බර් 09 දින ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති අතර බඳවා ගැනීම සිදුකරන තෙක් මෙම දෙපාර්තමේන්තුවට අනුමත විගණන නිලධාරි තනතුරු 20 සඳහා සංවර්ධන නිලධාරීන් 20 දෙනෙකු මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කරනු ලබන බව. | විගණන නිලධාරි තනතුරේ පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය. |

## 1.5.18 ශීර්ෂය - 263 වයඹ පළාත් ආදායම් දෙපාර්තමේන්තුව

### 1.5.18.1 අනුකූල නොවීම

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1990 අංක 08 දරන වයඹ පළාතේ මුදල් ප්‍රඥප්තියේ 104 (3) (ආ) වගන්තිය | පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට දිරිදීමනා ගෙවිය හැකි ලෙස දක්වා තිබුණ ද, පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නොවන නිලධාරීන් සඳහා 2025 ජනවාරි 01 සිට 2025 ජූනි 30 දක්වා රු.503,102 ක දිරි දීමනා ආණ්ඩුකාර අනුමැතිය මත ගෙවා තිබුණි. | දෙපාර්තමේන්තුවේ කාර්යයන් නියමිත ආදායම් ඉලක්කයන් කරා මෙහෙය වීමට දිරි දීමනා අනුමත කිරිමේ කමිටුව සෘජු දායකත්වයක් ලබාදෙන හෙයින්, මෙම දෙපාර්තමේන්තු නොවන නිලධාරීන් 04 දෙනා සඳහා දිරි දීමනා ගෙවීම ගැටලුවක් නොවන බව . | අධිකාරි බලය ලැබී ඇති ආකාරයට පමණක් ගෙවීම් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.18.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු තනතුරු 03 ක් හා බදු නිලධාරි තනතුරු 01 ක් 2025 වර්ෂයේ සිට පුරප්පාඩුව පැවත එන අතර, විගණිත දින වන 2026 පෙබරවාරි 13 දින වන විටත් එම පුරප්පාඩු සම්පූර්ණ කර නොතිබුණි. 2021 වර්ෂයේ සිට 2025 දක්වා කාලය තුළ ලියාපදිංචි කරන ලද ඔප්පු ප්‍රමාණය 325,544 න් දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කර තිබුණු ඔප්පු ප්‍රමාණය 29,662 ක් වූ අතර එය ලියාපදිංචි ඔප්පු ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස සියයට 9 ක ඉතා පහළ අගයක් විය. පරීක්ෂා කරන ලද සියයට 9 ක ඔප්පු ප්‍රමාණයෙන් රැස් කරන ලද අතිරේක මුද්දර ගාස්තු ආදායම | තක්සේරුකරුවන් 03 දෙනෙකු හා බදු නිලධාරියෙකු බඳවා ගැනීමට 2026 මාර්තු 03 දිනැති අමප/26/0380/802/002-I දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අනුමැතිය ලබා දී ඇති බව. | පුරප්පාඩු සම්පූර්ණ කරගෙන ආදායම් රැස්කිරීමේ කාර්ය ඉහළ නැංවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | රු.764,000,000 ක් වූ අතර, ඒ අනුව පරීක්ෂා නොකරන ලද සියයට 91 ක ඔප්පු ප්‍රමාණය ද, පරීක්ෂාවට ලක් කළේ නම් රැස්කරගතහැකිව තිබුණු විශාල ආදායමක් මෙම තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට නොහැකි වීම මත පළාත් සභාවට අහිමි වී තිබුණි. | | |

**1.5.19 ශීර්ෂය 264 - වයඹ පළාත් භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව**

**1.5.19.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 183.1 රීතිය | සෑම ගෙවීමක්ම වවුචරයේ සඳහන් දළ මුදල ලැබුණු බවට ආදායකයාගෙන් ලබාගත්, කුවිතාන්සියක් මඟින් තහවුරු විය යුතු වුවත්, පළාත් භාණ්ඩාගාරය විසින් පළාත් පාලන ආයතන වලට 2025 වර්ෂයේදී රු.451,965,231 ක මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් නිදහස් කර තිබුණ ද, ඒ සඳහා ලැබීම් කුවිතාන්සි ලබාගෙන නොතිබුණි. | මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් නිදහස් කිරීමට අදාළ මෙතෙක් ලැබී නොමැති කුවිතාන්සි ගෙන්වා ගැනීමට ඉදිරි කටයුතු කරන බව. | වයඹ පළාත් මූල්‍ය රීති සංග්‍රහයේ 183.1 රීතිය අනුව කටයුතු කළ යුතුය. |

**1.5.19.2 මතභේදයට තුඩුදුන් ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ 2025 මූල්‍ය කාර්ය සාධන වාර්තා අනුව රජයේ ප්‍රාග්ධන ප්‍රදාන රු.7,237,342,266 ක් වී තිබුණු අතර, එයින් රු.4,968,672,434 ක් පළාත් ආයෝජන වියදම් ලෙස මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණි. ඉතිරි රු.2,268,669,832 ක | අදාළ සංවර්ධන ව්‍යාපෘතීන් මෙම වසරේදී ක්‍රියාත්මක කරන බව. | ප්‍රදාන වශයෙන් ලැබෙන මුදල් නිශ්චිත කාලසීමාව තුළ උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

මුදල සමුච්චිත අරමුදලට මාරුකර තිබුණි. ඒ අනුව ප්‍රාග්ධන වියදම් සඳහා ලද රු.2,268,669,832 ක් වර්ෂය තුළ වියදම් නොකර සමුච්චිත අරමුදලට මාරුකර තිබුණි.

**1.5.19.3 කළමනාකරණ දුර්වලතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාහන ආදායම් බලපත්‍ර දිරිදීමනා නිලධාරීන් අතර බෙදී යන ආකාරය පිළිබඳව ආණ්ඩුකාර අනුමැතිය ලැබී තිබුණ ද, දිරි දීමනා ගෙවීමට අදාළ නීතිමය ප්‍රතිපාදන (උදා: පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට 1990 අංක 08 දරණ වයඹ පළාත් මුදල් ප්‍රඥප්තියේ 104 (අ) (3) (ආ) වගන්තිය මඟින් නීතිමය ප්‍රතිපාදන සකසා ඇති ආකාරයට) විගණනයට ඉදිරිපත් කර නොතිබුණු අතර 2025 මැයි සිට සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා ගෙවූ දිරි දීමනා වටිනාකම රු.1,728,413 ක් වුවද ඒ සඳහා ප්‍රඥප්තියක් සකස් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පළාත් සභාව ඉදිරියේදී ස්ථාපිත කළ පසුව, වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීම හා ඒ සම්බන්ධ කරුණු පිළිබඳ විධිවිධාන අඩංගු වන පරිදි ප්‍රඥප්තියක් සම්මත කර ගැනීමට කටයුතු කරන බව. | ගෙවීම් කිරීමේදී අධිකාරි බලය පිළිබඳව අවධානය යොමු කිරීමට කටයුතු කළ යුතුය. |

**1.5.20 වාණිජ අත්තිකාරම් ගිණුම්**

**1.5.20.1 වයඹ පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විෂය අංක 24303 පේෂ කර්ම මධ්‍යස්ථාන පවත්වාගෙන යාම පිළිබඳ වාණිජ අත්තිකාරම් ගිණුම**

**1.5.20.1.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය කර ගන්නා ලද බෝයගනේ ජනසළු මධ්‍යස්ථානයේ ස්ථාන භාර නිලධාරිනිය විසින් සිදු කරන ලද | ඉදිරි විනයානුකූල ක්‍රියාමාර්ග ගනිමින් රජයට අයවිය යුතු මුදල අයකර ගැනීමට කඩිනමින් කටයුතු කරන බව. | මූලික විමර්ශනයක් පවත්වා වගකිව යුතු නිලධාරින්ගේන් රජයට සිදුවී ඇති අලාභ අය කර ගැනීමට කටයුතු කල යුතුය. |

වටිනාකම රු.2,263,980 ක් වූ මූල්‍ය වංචාව සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 27.11 උපවගන්තිය යටතේ විනය පරීක්ෂණයක් පවත්වා ගෙන යා යුතු වුවද 2025 ජුලි 31 විගණිත දින වන විටත් වසර 01 කට වැඩි කාලයක් ගත වී තිබූ අතර, විමර්ශන නිලධාරියා පත් කර තිබුණද මූලික විමර්ශනයක් පවත්වා රජයට සිදුවී ඇති අලාභ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 1.5.20.2 විෂයය අංක 25102 - දරන "ගොවිපල කටයුතු මෙහෙයවීම හා බිත්තර වී සැපයීම" සඳහා වූ වාණිජ අත්තිකාරම් ගිණුම

#### 1.5.20.2.1 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 දෙසැම්බර් 18 දින සිදුකළ ගල්ගමුව කෘෂි ගොවිපල ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අලි වැටක්ද සවිකර තිබූ අක්කර 15.6 ක භූමි ප්‍රමාණයක් වගාවෙන් තොරව පැවතුණි. | විගණන ක්ෂේත්‍ර පරීක්ෂණය සිදුකරන අවස්ථාවේ එම වර්ෂය තුල වගාකල වගාවන් අස්වනු නෙලා අවසන්ව පැවති අතර අධික වර්ෂාව සහිත කාලය නිසා කිසිදු වගාවක් ආරම්භ කිරීමට නොහැකි තත්ත්වයක් පැවති ඇත. ගොවිපල වටා විදුලි වැටක් සවිකර ඇති අතර එමගින් පවතින වගා ක්ෂේත්‍ර වන අලි උවදුරින් ආරක්ෂා කර ගැනීම සඳහා බව. | රජයේ ගොවිපලක් වන මෙය ඉතා හොඳින් ගොවීන්ට ආදර්ශයක් ගතහැකි වන ආකාරයට වගාකර රජයට ආදායම් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

#### 1.5.20.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාරියපොල රජයේ ගොවිපොල අක්කර 104 ක භූමි ප්‍රමාණයක පවතින අතර, මෙහි ප්‍රධාන වශයෙන් පොල්වලට අතිරේකව පළතුරු වගාවක් පැවතියද වගා නොකළ භූමි ප්‍රමාණය සාපේක්ෂව වැඩි බව නිරීක්ෂණය | වගා නොකළ භූමි ලෙස හඳුනාගත් බිම් කොටසේ ගව පාලනය සඳහා අවශ්‍ය තෘණ විශේෂ වගා කර අඩ නිදැලි ක්‍රමය යටතේ ගවයින්ගේ ආහාර අවශ්‍යතාවය සපයා දීමට භාවිතා කෙරේ. කොන්ත්‍රාත් සේවකයෙකුගේ දැනට ගෙවනු ලබන අනුමත සාමාන්‍ය දෛනික වැටුප | මෙම භූමිය ආදර්ශ ගොවිපලක් ලෙස සකස් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සකසා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| විය. මේ සඳහා ප්‍රධාන වශයෙන් කම්කරුවන්ගේ හිඟය හා ජලය ලබාගැනීමේ මූලාශ්‍ර ගැටළු හේතුවී ඇති බව අනාවරණය වූ නමුත් ඒ සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | රු.1,748 ක් වන අතර එබැවින් නව සේවකයන් ගොවිපලෙහි සේවය සඳහා පැමිණීමට මැලිකමක් දක්වයි. දෛනිකව අත්‍යවශ්‍යයෙන්ම සිදු කළ යුතු ගොවිපල රාජකාරිවලට ප්‍රමුඛතාවය ලබා දිය යුතු බැවින් අනෙකුත් වගා කටයුතු සඳහා යොමු වීම සීමාකාරී වේ. ජලය සපයා ගැනීමේ දී ඇතිවන ගැටලුවට පිළියමක් ලෙස 2026 වසරේ ගොවිපල සංවර්ධන පස් අවුරුදු සැලැස්ම යටතේ හෙක්ටයාර 01ක වපසරියක වැවක් සෑදීමට යෝජනා කර ඇත. එමගින් මෙම ජල ගැටළුව විසඳා ගැනීමට හැකි වන බව. | |

**1.5.20.3 වයඹ ප්‍රධාන ලේකම් කාර්යාලයේ "වයඹ පුහුණු ආයතනය" අත්තිකාරම් ගිණුම - 26002**

**1.5.20.3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පුහුණු ආයතනය පිහිටුවා මේ වන විට වසර 32 ක කාලයක් ගතවී තිබුණ ද, පුහුණු ආයතනය පිහිටා ඇති අ.ග.රි.2679 පිඹුරේ කැබලි අංක 147 සහ අ.ග.පි 2608 පිඹුරේ කැබලි අංක 102 දරණ ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි කටයුතු වාරියපොල ප්‍රාදේශීය ලේකම් මඟින් සිදුකරන අතර එම කටයුතු කඩිනම් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන බව. | කඩිනමින් ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය. |

**1.5.21 වයඹ කර්මාන්ත සේවා කාර්යාංශය**

**1.5.21.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2024 දෙසැම්බර් 23 දිනැති 03/2024 හා 2025 දෙසැම්බර් 02 | රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩල සහ රජය සතු සමාගම් සෑම වර්ෂයක් පාසාම බදු පසු ලාභයෙන් | බදු ගෙවීම සම්බන්ධයෙන් කාර්යාංශයේ ප්‍රඥප්තියට අනුකූලව සහ ශ්‍රී ලංකා පොදු ව්‍යාපාර සඳහා වන | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 03/2024 හා 02/2025 ප්‍රකාරව ශුද්ධ ලාභයෙන් පළාත් භාණ්ඩාගාරයට |

| | | | |
|---|---|---|---|
| දිනැති අංක 02/2025 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | අවම වශයෙන් සියයට 30 ක් ඒකාබද්ධ අරමුදලට අයබදු/ලාභාංශ ගෙවා ඇත්නම් පමණක් නිලධාරීන්ට ප්‍රසාද දීමනා ලබාගැනීමට හිමිකමක් පවතී. නමුත් සඳහන් කල චක්‍රලේඛවලට අනුගතව වයඹ පළාත් සභාව විසින් චක්‍රලේඛ නිකුත් නොකිරීම හේතුවෙන් 2021 වර්ෂයේ සිට 2024 දක්වා අඛණ්ඩව උපයන ලද රු.70,960,521 ක ශුද්ධ ලාභයෙන් පළාත් භාණ්ඩාගාරයට අයබදු/ලාභාංශ අයකර ගැනීමට නොහැකිව තිබුණි. | ගිණුම්කරන ප්‍රමිති අනුව ආදායම් සහ වියදම් හඳුනා ගැනීමෙන් අනතුරුව ඉතිරිය අතිරික්තයක් ලෙස හඳුනා ගන්නා අතර, බදු ගෙවීම පිළිබඳ වැඩිදුර තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් දුරකථන මාර්ගයෙන් විමසීම් කළ අතර, ඒ පිළිබඳ නිශ්චිත පිළිතුරක් අප වෙත නොලැබුණි. එබැවින් ඉදිරියේදී ලිඛිත දැනුම්දීමකින් මේ පිළිබඳ විමසීම් කිරීමට බලාපොරොත්තු වන අතර, හැකි ඉක්මනින් ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගැනීමට හුදෙක් අපේක්ෂා කර ඇති බව. | අයබදු ලාභාංශ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.21.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1990 අංක 11 දරන කර්මාන්ත සේවා කාර්යාංශය ප්‍රඥප්තියේ 01 වන කොටසේ 04 වන කරුණ යටතේ කාර්යාංශය විසින් ඉටුකල යුතු කාර්යභාරයන් ලෙස අරමුණු 08 න් වර්තමානය වන විට අරමුණු 05 ක් නිසියාකාරයෙන් ඉටු වී නොතිබුණි. | රජයේ භාණ්ඩාගාරයෙන් අරමුදල් නොලබන ස්වයං ඉපයීම් ආයතනයක් ලෙස ආයතනයේ සේවක වැටුප් ගෙවීම සහ දෛනික නඩත්තු වියදම් සඳහා මුදල් ඉපයීම ඉතාමත් අත්‍යවශ්‍ය කරුණක් වුවද හැකි සෑම අවස්ථාවකදීම එකී අරමුණු ඉටුකරමින් ප්‍රාදේශීය මට්ටමෙන් ඔබ්බට ගොස් ජාතික තලය දක්වාම අපගේ සේවා ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබී ඇති බව. | ආයතනයේ අරමුණු ලඟාකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.21.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපාර සංවර්ධන නිලධාරි හා කර්මාන්ත සංවර්ධන නිලධාරි යන තනතුරු දෙක අනුමත කර ගැනීමකින් තොරව නිලධාරීන් දෙදෙනෙකු ද අනුමතව පවතින උපදේශක හා ගිණුම් සහකාර යන තනතුරු සඳහා අනුමත සීමාව ඉක්මවා පුද්ගලයන් තිදෙනෙකු ද කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2024 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් දක්වා ගෙවා තිබූ දළ වැටුප රු.3,366,588 ක් විය. | මෙම තනතුරු දෙක සඳහාම කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම් සිදුකර ඇති බවත්, එකී පිරිවැය කාර්යාංශයේ පිරිවැය මගින් දරණ බවත් දන්වා සිටිමි. එසේම ආයතනයේ අඛණ්ඩ පැවැත්ම සඳහා අත්‍යවශ්‍යවන සේවා ව්‍යාප්තිය සහ ප්‍රාදේශීය ව්‍යාපාර සංවර්ධනය සඳහා අවශ්‍ය ව්‍යාපෘති ආරම්භ කර පවත්වා ගෙන යාම සඳහා වෙනම නිලධාරියෙකු අත්‍යවශ්‍ය බවත් එම තනතුරු දෙක ඉදිරියේදී සිදුකිරීමට නියමිත කාර්ය මණ්ඩල සංශෝධනය සඳහා මේ වන විට යොමු කර ඇති බව. | අනුමත කාර්ය මණ්ඩලය අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව බඳවා ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.5.22 වයඹ මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරිය

### 1.5.22.1 කළමනාකරණ අකාරයක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මාර්ග බලපත්‍ර නිකුත් කිරීම, සංශෝධනය කිරීම හා අයිතිය විධිමත් කිරීම සම්බන්ධ නියෝග සකස් කර ගැනීමට කටයුතු කර නොතිබියදී 2025 වර්ෂය තුල රු.32,462,195 ක නව බලපත්‍ර 24 ක් නිකුත් කිරීම, රු.1,045,000 ක මාර්ග 24 ක මාර්ග සංශෝධනයන් සිදුකිරීම හා රු36,700,000 ක වටිනාකමැති මාර්ග බලපත්‍ර 81 ක අයිතිය විධිමත් කිරීමට කටයුතු කර තිබුණි. | වයඹ පලාත් සභාවේ 2018 අංක 07 දරණ මාර්ගස්ථ මගී ප්‍රවාහන ප්‍රඥප්තියේ 11 වන කොටසෙහි අංක 18 යටතේ පලාත් මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බලතල සහ කාර්යයන් යටතේ මාර්ග බලපත්‍ර නිකුත් කිරීම සංශෝධනය කිරීම අයිතිය විධිමත් කිරීම සඳහා ප්‍රතිපාදන සැකසී ඇත.මේ වන විට එම කාර්යන් සඳහා v වැනි කොටසේ අංක 40( 02) (ආ) යටතේ නියෝග නීති අංශය වෙත යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවතින බව. | ප්‍රඥප්තියේ වගන්ති සම්බන්ධයෙන් කඩිනමින් රීති සකස් කර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 ජේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුර සඳහා පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවාව අවශ්‍ය වන්නේ නම් නිත්‍ය පත්වීම නොපමාව කළයුතු අතරම නිත්‍ය නිලධාරියෙකු අවශ්‍ය නොවේනම් ආයතනයේ අනෙකුත් නිලධාරීන් අතර රාජකාරි බෙදා හැරීම කළයුතු බව දක්වා තිබුණද අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරට වර්ෂ 10 ක සිට ස්ථිර පදනම මත සුදුසු පුද්ගලයකු පත්කර ගැනිමට කටයුතු කර නොතිබුණි. | මෙම තනතුරු සඳහා බඳවා ගැනීමට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ පරීක්ෂණයක් පැවති අතර එහි දී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි, ධාවන කළමණාකාර සහකාර හා ධාවන කළමණාකාර බඳවා ගැනීමට අදාළ ප්‍රතිඵල සම්බන්ධව ගරු ආණ්ඩුකාරතුමාගේ පැමිණිල්ලක් ඉදිරිපත් වී ඇති බැවින් ආණ්ඩුකාරතුමාගේ පිළිතුරු ලැබෙන තුරු නැවත පත් කිරීම් සිදු කළ නොහැකි බව දන්වා සිටින අතර ගිණුම් නිලධාරි තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම සපුරා තිබූ නිලධාරිණිය ගිණුම් නිලධාරි තනතුරේ වැඩ බැලීම සඳහා පත් කරන ලද බව. | ආයතන සංග්‍රහයේ වගන්ති වලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ 2 (i) වගන්තිය ප්‍රකාරව බදුවන ආදායමක් ඇති සෑම පුද්ගලයෙකුම පනතේ පළමුවන උපලේඛණයේ අදාල බදු අනුපාත යටතේ ආදායම් බදු ගෙවිය යුතු වුවද, අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ රු.16,624,216 ක ලාභයක් උපයා තිබුණද, පනතේ දෙවන පරිච්ඡේදය ප්‍රකාරව බදු අයකල හැකි ලාභය ගණනය කොට ආදායම් බදු ගෙවීමට කටයුතු කර නොතිබුණි. | වර්ෂය තුළ උපයනු ලබන ලාභයෙන් ආදායම් බදු ගෙවීම දැනට ශ්‍රී ලංකාව තුළ ඒ ඒ පළාත්වල ස්ථාපිත කර ඇති ප්‍රවාහන අධිකාරීන් විසින් සිදු නොකරන ලද අතර මෙම ආදායම් බදු ගෙවීම සම්බන්ධයෙන් එම පළාත් ප්‍රවාහන අධිකාරි වෙතින් තොරතුරු ලබා ගන්නා ලද අතර එහි දී සියළු ප්‍රවාහන අධිකාරීන් වාර්ෂික ලාභයෙන් ආදායම් බදු නොගෙවන බව තහවුරු වූ බව. | දේශීය ආදායම් බදු පනතට අනුකූලව කටයුතු කල යුතු අතර ආදායම් බදු වලින් නිදහස් වන්නේ නම් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවෙන් ඒ සම්බන්ධයෙන් තහවුරුවක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ 2025 දෙසැම්බර් 31 වනවිට බැංකු ගිණුම් 3 ක රු.25,196,105 ක ශේෂයක් පැවති අතර 2025 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම අනුව මාසික ආයතනික කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය හඳුනාගනිමින් අමතර මුදල් ආයෝජනය කර මුදලට පවතින ආවස්ථික පිරිවැය කළමනාකරණය කරගැනීමට කටයුතු කර නොතිබුණි. මේ හේතුව | අංක 02/2016 ට අනුව හිග වැටුප් ගෙවීම සඳහා රු.මිලියන 16.5 පමණ ප්‍රමාණයක් වැයවන බැවින් මහජන බැංකුවේ සහ ලංකා බැංකුවේ ජංගම ගිණුම්වල මාසිකව අතිරික්ත ශේෂයක් පවත්වාගෙන ගිය බවත් එම හිග වැටුප් ගෙවීම කටයුතු අවසාන වූ බැවින් මින් ඉදිරියට ආදායම් වියදම් තුලනය කර අතිරික්ත ආදායම ස්ථාවර තැන්පත් ආයෝජනය සඳහා අධ්‍යක්ෂ | ජංගම ගිණුම් වල අවශ්‍ය ප්‍රමාණයට පමණක් මුදල් තබාගෙන අනෙක් මුදල් කාර්යක්ෂම ලෙස අයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| මත මහජන බැංකුවේ ගිණුම් 02 ක වර්ෂය පුරාම අවම මාසික ශේෂය පිළිවෙලින් රු.12,000,000 ක් හා රු.100,000 ක් ඉක්මවා තිබුණ අතර, ලංකා බැංකුවේ ගිණුමක වර්ෂය පුරාම අවම මාසික ශේෂය රු.100,000 ඉක්මවා තිබුණි. 2025 වර්ෂයේ රජයේ වාණිජ බැංකුවල ප්‍රකාශිත මාසික ස්ථාවර තැන්පතු පොලිය සියයට 5.75 ලෙස සැලකීමේදී අධිකාරියේ ගිණුම්වල වර්ෂය පුරාම අඛණ්ඩව පැවති මාසික අවම ශේෂය ස්ථාවර තැන්පතු ආයෝජනය නොකර ජංගම ගිණුම්වල තබාගැනීමෙන් දළ වශයෙන් රු.4,896,060 ක පොලී ආදායමක් ලබාගැනීමට තිබූ අවස්ථාව අහිමි වී තිබුණි. | මණ්ඩලයට යොමු කර අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරණු ලබන බව. | |

**1.5.22.2 මෙහෙයුම් ආකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2013 වර්ෂයේ සිට 2025 දෙසැම්බර් 31 දක්වා කාලයට අදාලව අධිකාරිය වෙත ලැබිය යුතු මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු රු.12,350,000 ක් හා ප්‍රමාද ගාස්තු රු.2,446,950 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට ද, අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ ශේෂය කපා හැරීම සඳහා 2025 ජූලි 25 දින අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව ගරු ආණ්ඩුකාරවරයාගේ අනුමැතියට ඉදිරිපත් කිරීමට ඉදිරි කටයුතු සිදු කරමින් පවති.අන්තර් පළාත් බස්රථ සම්බන්ධ හිඟ මාසික ධාවන සටහන් පත්‍ර ගාස්තු සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් 2026 ජනවාරි 13 දිනැති NTC/OP/PA/18/156 දරන ලිපිය මඟින් හිඟ අයකර ගැනීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර තීරණයක් ලබාදෙන බව. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) | 2013 වර්ෂයේ සිට 2025 දක්වා කාලයට අදාලව ලැබිය යුතු පිවිසුම් පත්‍ර ආදායම් රු.2,004,100 ක් හා ප්‍රමාද ගාස්තු රු.342,800 ක් | අන්තර් පළාත් බස්රථ සම්බන්ධයෙන් හිඟ මාසික පිවිසුම් ගාස්තු සම්බන්ධයෙන් ජාතික ගමනාගමන කොමිෂන් සභාව විසින් | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසන් වන විට ද, අයකරගැනීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2026 ජනවාරි 13 දිනැති අංක NTC/OP/PA/18/156 දරන ලිපිය මගින් හිඟ අයකර ගැනීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට යොමුකර තීරණයක් ලබාදෙන බව. | |
| (ඇ) | 2019 වර්ෂයේ සිට 2022 දක්වා කාලයට අදාල ලැබිය යුතු අමතර ගමන්වාර ආදායම රු.2,294,800 ක් හා ප්‍රමාද ගාස්තු රු.658,100 ක් සමාලෝචිත වර්ෂය තුලදී අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | අමතර ගමන්වාර හිඟ ශේෂයන් ඉදිරියට පැමිණීම වළක්වා ගැනීම පිණිස බස් හිමියාගේ ඉල්ලීම සැලකිල්ලට ගෙන ඒකවර අමතර ගමන්වාර බලපත්‍රය මාස 03 ක් සඳහා ලබා දීම සිදුකර ඇති අතර හිඟ ශේෂය කපා හැරීම සඳහා කමිටුවක් පත් කර නිර්දේශ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය බව. | හිඟ ආදායම් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | රියදුරු අභ්‍යාස විද්‍යාලයේ 2025 වර්ෂයේ රු.1,297,309 ක අලාභයක් දක්නට ලැබුණි. 2024 වර්ෂයේ රියදුරු අභ්‍යාස විද්‍යාලයට පුහුණුලාභීන් 157 ක් ඇතුලත්ව තිබුණද 2025 වර්ෂයේ පුහුණුලාභීන් 85 දෙනෙකු පමණක් පුහුණුව සඳහා ඇතුලත්ව තිබීම ආදායම් අඩුවීමට හේතු වී තිබුණි. | උපදේශක මහතුන් හිඟකම මෙම ගැටළුකාරී තත්ත්වයට හේතුවක් වන අතරම දැනට රියදුරු අභ්‍යාස විද්‍යාලයට වෙන් වූ වාහන අවුරුදු 25 පමණ පරණ වාහන වන අතර නිරන්තරයෙන් දෝෂ මතුවන හෙයින් අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර දීර්ඝ කාලයක් බලා සිටිය යුතු බැවින් පුහුණු ලාභීන් සඳහා ප්‍රායෝගික පුහුණුව සඳහා ගැටළුකාරි තත්වයක් පැන නැගී ඇති බව. | උපදේශකවරුන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර යුතු අතර පුහුණු ලාභීන් ප්‍රමාණය වැඩිකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.22.3 නිෂ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2025 වර්ෂයේ රියදුරු උපදේශකවරුන් බඳවාගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වනු ලැබුවද රියදුරු උපදේශන බලපත්‍රය පැවතියද බඳවා ගැනීම් පටිපාටියේ දක්වා ඇති සුදුසුකම් සහිත කිසිදු නිලධාරියෙකු ඉදිරිපත් නොවීම හේතුවෙන් එම තනතුරට නිලධාරින් බඳවාගැනීමට නොහැකිව පැවතුණි. බඳවාගැනීමේ පටිපාටිය සංශෝධනය කර හෝ බලපත්‍රය | රියදුරු උපදේශකවරු බඳවා ගැනීමට පුවත්පත් දැන්වීම් එල කර බඳවා ගැනීම් පටිපාටියට අදාළව අධ්‍යාපන සුදුසුකම් සපුරා නොතිබීම හේතුවෙන් සම්මුඛ පරීක්ෂණ අවස්ථා 02 ක දී අයදුම්කරුවන් තෝරා ගැනීමට නොහැකි විය. එබැවින් බඳවා ගැනීම් පටිපාටිය සංශෝධනය කටයුතු සිදු කරමින් පවතින අතර බර වාහන බලපත්‍ර ලබාදීමේ කටයුතු ආරම්භ කිරීමට | රියදුරු උපදේශක වරුන් බඳවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර නිෂ්කාර්යව පවතින බස්රථය ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| සහිත උපදේශකවරයකු බඳවාගැනීමට කටයුතු නොකිරීම මත රියදුරු අභ්‍යාස විද්‍යාලයේ කටයුතු පවත්වාගෙන යාමට නොහැකි තත්ත්වයක් උද්ගතව පැවතුණි. 2025 වර්ෂය අවසන් වන විටත් රියදුරු අභ්‍යාස විද්‍යාලයේ පුහුණු කටයුතු වෙනුවෙන් 2006 වර්ෂයේ මිලදී ගෙන තිබුණු තක්සේරු වටිනාකම රු.1,500,000 ක් වූ බස්රථය නිෂ්කාර්යව පැවතුණි. | සැලසුම් කර ඇත.දැනට එම බස්රථ විවිධ ආයතන වෙත විශේෂ චාරිකා සඳහා සහනදායි මිල යටතේ ප්‍රවාහන පහසුකම් සැපයීම් කටයුතු යොදා ඇති බව. |

## 1.5.23 වයඹ සංවර්ධන අධිකාරිය

### 1.5.23.1 අරමුණු වලින් බැහැර ක්‍රියාකාරකම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් සභාවේ 1993 අංක 01 දරන වයඹ සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ I වන කොටසේ 04 වන ජේදය යටතේ(අ) සිට (ඒ) දක්වා අරමුණු 10 ක් දක්වා තිබුණද අධිකාරිය විසින් එයින් අරමුණු 2 ක් හැර ඉතිරි අරමුණු 8 ඉටුකිරීම වෙනුවට පරිබාහිරව වයඹ සංචාරක හෝටල් පාසලේ පුහුණු විම් යටතේ විවිධ පාඨමාලා පැවැත්වීම, පළාත් පාලන ආයතන සඳහා මෘදුකාංග සපයා සවිකිරිම හා නඩත්තු කිරීම, අධිකාරිය සතු දේපළ බදුදීම වැනි විවිධ ව්‍යාපෘති ගණනාවක් සිදුකරනු ලබන අතර එම වැඩසටහන් තම අරමුණු වලට ඇතුලත් කරමින් අධිකාරියේ ප්‍රඥප්තිය සංශෝධනය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වයඹ සංවර්ධන අධිකාරියේ අරමුණු හා කාර්යයන් වර්මානයට ගැලපෙන පරිදි සකස් කර ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා කෙටුම්පත් සකස් කර ඇති අතර, වර්තමානයේ පළාත් සභාව ක්‍රියාත්මක නොවීම මත ඉදිරි කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව. | වර්තමාන ක්‍රියාකාරිත්වයට ගැලපෙන පරිදි අධිකාරියේ ප්‍රඥප්තියේ අරමුණු සංශෝධනය කරගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.5.24 වයඹ මානව සම්පත් සංවර්ධන අධිකාරිය

### 1.5.24.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2008 වර්ෂයේ සිට ආපසු ගෙවන කාලය අවුරුදු 3 හා 5 යන කාල සීමා යටතේ අපේක්ෂා තනි පුද්ගල ණය ව්‍යාපෘතිය මඟින් පුද්ගලයින්ට ලබාදුන් රු.3,250,000 ක ණය මුදලට අදාළව 2026 මාර්තු 31 දිනට රු.1,297,179 ක හිඟ ණය වාරික මුදලක් ද රු.287,813 ක හිඟ පොලී මුදලක් ද පවතින අතර, හිඟ වාරික ප්‍රමාණය 02 ත් 57 ත් අතර පරාසයක විය. ඇතැම් පුද්ගලයින්ගේ ණය කාල සීමාව ඉක්මවා ගොස් තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම ණය ශේෂ අය වී නොතිබුණු අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග අධිකාරිය විසින් ප්‍රමාණවත්ව ගෙන නොතිබුණි. | හිඟ ණය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | හිඟ ණය වාරික මුදල් හා පොලී මුදල් අයකර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග කඩිනම් කළ යුතුය. |
| (ආ) | අධිකාරිය විසින් ගවේෂණී තනි පුද්ගල ණය ව්‍යාපෘතිය යටතේ 2009 වර්ෂයේ සිට 2023 දක්වා පුද්ගලයින් 19 දෙනෙකුට ලබාදුන් රු.3,450,000 ක ණය මුදලට අදාළව වාරික 05 ත් 59 ත් අතර හිඟ වාරික හා හිඟ ණය පොලිය රු.2,196,562 ක් සමාලෝචිත වර්ෂය අවසානයට හිඟව පැවතුණි. | තනිපුද්ගල ණය ඇපකරුවන්ගේ වැටුපෙන් අයකිරීමට කටයුතු කර ඇති බැවින් මේ වන විට අයවෙමින් පවතින බව. | හිඟ ණය වාරික මුදල් හා පොලී මුදල් අයකර ගැනීම කඩිනම් කළ යුතුයි. |

## 1.5.25 වයඹ යන්ත්‍රෝපකරණ අධිකාරිය

### 1.5.25.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුලී ගාස්තු, අළුත්වැඩියා ගාස්තු, සේවා ගාස්තු හා සිවිල් වැඩ ගාස්තු වශයෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට ලැබිය යුතු ශේෂය රු.66,869,546 ක්වූ අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂය රු.10,071,548 ක ණය ශේෂය නිරවුල් කරගැනීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විට කටයුතු කර නොතිබුණි. | 2026 අප්‍රේල් 30 දින වන විට රු.49,991,981 ක මුදලක් අයවී ඇති අතර රු. 16,877,564 ක මුදලක් තව දුරටත් ලැබීමට හිඟ මුදල් ලෙස පවතී. වසර 20කට වඩා පැරණි කුලි ගාස්තු ණය ශේෂ වල එකතුව ලෙස රු.7,049,984.87 ක මුදලක් අය කර ගැනීමට පවතින අපහසුතාවය මත අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල ඉල්ලීම අනුව නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය මත සමුච්චිත ලාභයට එරෙහිව කපා හැරීමට ඇති බව. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | 2025 දෙසැම්බර් 08 දින වන විට අධිකාරියේ අනෙකුත් තනතුරු 09 කට අදාලව අනුමත කර්ය මණ්ඩලය 53 ක් වු අතර තත්‍ය කාර්ය මණ්ඩලය 22 ක් වීමෙන් තනතුරු 09 කට අදාලව නිලධාරින් 31 ක පුරප්පාඩු පැවතුණි. | පිළිතුරු ඉදිරිපත් කර නැත. | අවශ්‍යතාවය සලකා බලා තනතුරු පුරප්පාඩු සඳහා අනුමැතිය ලබාගෙන නව බඳවා ගැනීම් කඩිනම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 1.5.25.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසානයට මෙවලම් හා උපකරණ ශේෂය රු.28,705,629 ක් වු අතර එම ශේෂය තුල ADB පරිත්‍යාග යටතේ රු.17,974,616 ක් වටිනා උපකරණ ශේෂයක් පැවතියද එම උපකරණ තක්සේරු කර හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | ADB පරිත්‍යාග වශයෙන් ලැබු රු.මිලියන 17 ක් වටිනා උපකරණ වලින් කොටසක් හඳුනා ගෙන 2026 වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර ඇති අතර ඉතිරි උපකරණ හඳුනාගෙන ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇත. | ප්‍රත්‍යාගණනය සිදුකර වත්කම් වල වෙළඳපොල අගය හඳුනා ගැනීමට කටයුතු කල යුතුය. |

### 1.5.25.3 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අධිකාරියේ පිරිවැය රු.7,275,000 ක් වූ වාහන 11 ක් හා පිරිවැය රු.2,055,000 ක් වූ යන්ත්‍ර 04 ක් භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින අතර එම වාහන හා යන්ත්‍ර වෙන්දේසි කිරීමට හෝ සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | අධිකාරිය විසින් කමිටුවක් පත් කර භාවිතයට ගත නොහැකි හා අලුත්වැඩියා කිරීම ආර්ථික වශයෙන් ඵලදායී නොවන යන්ත්‍ර හා වාහන හඳුනා ගැනීම සඳහා කමිටුවක් පත් කර ඇති අතර මෙම වර්ෂය තුල එම යන්ත්‍ර හා වාහන අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | භාවිතයට ගත නොහැකි මට්ටමේ පවතින යන්ත්‍ර හා වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.5.25.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණකාධිකාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයතන සංග්‍රහයේ II වන පරිච්ඡේදයේ 13.3 ඡේදය ප්‍රකාරව වැඩ බැලීමේ පත්වීමක් කල යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වන අතර තනතුර සඳහා පූර්ණකාලීන නිලධාරියෙකුගේ සේවාව අවශ්‍ය වන්නේ නම් නිත්‍ය පත්වීම නොපමාව කළයුතු අතරම නිත්‍ය නිලධාරියෙකු අවශ්‍ය නොවේනම් ආයතනයේ අනෙකුත් නිලධාරින් අතර රාජකාරි බෙදා හැරීම කළයුතු බව දක්වා තිබුණද අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ තනතුරට වර්ෂ 10 ක සිට ස්ථිර පදනම මත සුදුසු පුද්ගලයකු පත්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | 2026 මාර්තු 17 දිනැති නියෝජ්‍ය ප්‍රධාන ලේකම්ගේ ලිපිය මගින් කලමනාකරණ අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති අතර බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | ඉහල කලමනාකරණ මට්ටමේ තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

### 1.5.26 වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරිය

#### 1.5.26.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ ක්‍රියාකාරි සැලැස්මට අනුව පටක රෝපණ විද්‍යාගාරයේ කෙසෙල් පැල 18,000 ක් සහ විසිතුරු හා බෙහෙත් පැළ 100 ක් නිෂ්පාදනය කිරීමට සැලසුම් කර තිබුණද වර්ෂය තුළදී කෙසෙල් පැළ 761 ක් හා විසිතුරු හා වෙනත් මිරිස් පැළ 49 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි. විගණිත දිනය වු 2026 ජනවාරි 05 දින වන විටත් පටක රෝපණ ව්‍යාපෘතිය නිෂ්කාර්යව පැවතුණි. | 2025 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කෙසෙල් පැල 1800 ඇතුළු අනෙකුත් පැලද නිෂ්පාදනය කළ ඒවා නොවන අතර ඒවා එලෙස බාහිර ආයතනවලින් මිලදීගෙන අළෙවි කිරීමට සැලසුම් කරන ලද ඒවා බවත් පසුව බාහිර ආයතනවලින් මිලදීගෙන අළෙවි කිරීමද ඵලදායී නොවූ සහ අවදානම් සහගත බැවින් එම ක්‍රියාවලියද නතර කරන ලද අතර පවතින වගා ගෘහ ඒකක තුල මිරිස් වගාව ආරම්භ කර එහි අස්වැන්න නෙලාගෙන අලෙවි කර ඇති බව. | ක්‍රියාකාරි සැලැස්මට අනුව සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | 2001 අංක 1 දරන වයඹ ප්‍රාදේශීය සම්පත් සංවර්ධන අධිකාරියේ ප්‍රඥප්තියේ අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට අදාලව, එම ප්‍රඥප්තියේ 5 වන ඡේදයේ සඳහන් කාර්යයන් අතරින් කාර්යයන් 04 ක් ඉටුකර ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි. | 2025 වර්ෂය තුළ වයඹ පළාත් කෘෂිකර්ම හා ධීවර අමාත්‍යාංශය සමග ඒකාබද්ධව පළාතේ පාසල් සිසුන්, ගුරුභවතුන් සහ දෙමාපියන් මෙන්ම කලපු ආශ්‍රිත ප්‍රදේශවාසීන්ටද කඩොලාන සංරක්ෂණය, මත්ස්‍ය කර්මාන්තය තිරසාරව පවත්වාගෙන යාම, පරිසර සංරක්ෂණය යනාදී කරුණු පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 15 ක් පමණ 2025 වර්ෂය තුළ පවත්වා ඇති අතර තවද ධීවර කාන්තාවන් සවිබල ගැන්වීමේ වැඩසටහන් 10 ක් පවත්වා ඇති බව. | ප්‍රඥප්තියේ සඳහන් කර ඇති අරමුණු හා පරමාර්ථ ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2001 අංක 01 දරන වයඹ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රඥප්තියේ (23) 1 වගන්තිය අනුව අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වන කළමනාකරණ අධ්‍යක්ෂ පූර්ණ කාලීනව සේවයේ යෙදිය හැකි තැනැත්තෙක් අධ්‍යක්ෂ මණ්ඩලය | 2026 මැයි 25 දින සිට වෙනත් නිලධාරියෙකු මෙම අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ ධූරයේ වැඩ බැලීම සඳහා පත් කිරීමට තීරණය කරන ලද බව. | 2001 අංක 01 දරන වයඹ ප්‍රාදේශීය සංවර්ධන ප්‍රඥප්තියේ (23) 1 වගන්තිය ප්‍රකාරව අධිකාරියේ කළමනාකරණ අධ්‍යක්ෂ පත් කර ගත යුතු අතර මධ්‍යම රජයේ සේවයේ පූර්ණ කාලීන සේවයේ නිරත වන |

| | | |
|---|---|---|
| විසින් පත්කළ යුතු වුවද කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, ධීවර, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සහ ගොවිජන සංවර්ධන අමාත්‍යාංශ ලේකම් විසින් 2017 ජූනි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි එවකට කෘෂිකර්ම අමාත්‍යාංශයේ නියෝජ්‍ය සැලසුම් අධ්‍යක්ෂ, කළමනාකාර අධ්‍යක්ෂ (වැඩබලන) තනතුරට පත්කර තිබුණි. කළමනාකාර අධ්‍යක්ෂ 2025 මාර්තු 24 දින සිට කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් (වයඹ) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත මාරුවීමක් ලබා ගොස් පසුව පන්නල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලසුම් අධ්‍යක්ෂ ලෙස නිත්‍ය තනතුරේ රාජකාරි ඉටුකරමින් 2026 මැයි 25 දින දක්වා අධිකාරියේ කළමනාකාර අධ්‍යක්ෂ (වැඩබලන) තනතුරෙහි කටයුතු කර තිබුණි. | | නිලධාරියෙකු පළාත් සභා ආයතනයක වැඩ බැලීමට සේවයේ යෙදවීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කළ යුතුය. |

### 1.5.27 වයඹ ජනකලා පදනම

#### 1.5.27.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 13.3 වගන්තිය හා වයඹ පළාත් සභාවේ කාර්යය පටිපාටික රීති සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 113 II ප්‍රකාරව වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුත්තේ නිත්‍ය පත්වීමක් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් පමණක් වුවද, ජනකලා පදනමේ කළමනාකාර අධ්‍යක්ෂක, සහකාර අධ්‍යක්ෂක තනතුරු දෙක හා පරිපාලන නිලධාරීන් යන මාණ්ඩලික තනතුරු 04 සඳහා වර්ෂ 20 කටත් වඩා වැඩි කාලයක් වැඩ බලන නිලධාරීන් පත් කරන තිබුණි. 2025 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුක්ත මාණ්ඩලික | එම තනතුරු සඳහා බාහිරින් ස්ථිරව බඳවා ගැනීමට විශාල පිරිවැයක් දැරීමට සිදු වන බැවින් පුරප්පාඩුවී ඇති වයඹ ජනකලා පදනමේ මාණ්ඩලික නිළධාරි තනතුරු සඳහා වයඹ ජනකලා පදනමේ අධ්‍යක්ෂ මණ්ඩල තිරණ අනුව වැඩ බැලීම සඳහා පත් කර ඇති බව. | සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය) හැර අනෙක් මාණ්ඩලික තනතුරු එකක් සඳහා හෝ ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| නිලධාරීන් තිදෙනා ද වසර 03 සිට වසර 10 කට වැඩි කාලයක් වැඩ බැලීම් සිදු කර තිබුණි. | | |

### 1.5.27.2 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 වර්ෂයේ සැප්තැම්බර් 01 දින සිට ජනකලා අවන්හල ප්‍රසම්පාදන කටයුත්තක් සිදු නොකර අවන්හලේ ගොඩනැගිල්ල අබලන් තත්ත්වයේ පවතින බව සඳහන් කරමින් එකම බදුකරුවකු වෙත වසර 20 කට අධික කාලයක් බදු දී පවත්වාගෙන ගොස් තිබුණි. කුරුණෑගල නගරයෙහි නුවර පාරට මුහුණලා පවතින මෙම අවන්හල දීර්ඝ කාලීනව ජනප්‍රිය අවන්හලක් වන අතර, අබලන් තත්ත්වය පිළිබඳ විධිමත් පරීක්ෂාවකින් තොරව හා නවීකරණය කිරීමේ අවශ්‍යතාවය සම්බන්ධයෙන් තක්සේරුවකින් තොරව අවම තක්සේරු වටිනාකමට බදු දීම නිසා වසර 20 ක් පුරාවට උපයාගත හැකිව තිබූ බදු ආදායම රු.20,140,038 ක් විය. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණ අනුව ආදායම් උත්පාදනය කරමින් පවතින බව. | ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුව බදු දීමට කටයුතු කළ යුතුය. |

## 1.5.28 පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

### 1.5.28.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 අංක 04 දරන පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන අධිකාරිය ප්‍රඥප්තිය සහ ඊට අදාළව නිකුත් කළ 2005 ජූනි 03 දිනැති අංක 1395 /25 දරණ නියෝග මාලාවේ III වැනි උපලේඛනයේ අංක 01 වගන්තිය ප්‍රකාරව වයඹ පළාත තුල අවුරුදු 3 – 5 අතර, දරුවන් වෙනුවෙන් පවත්වාගෙන | සියළුම පෙර පාසල් වලට ලියාපදිංචිය සම්පූර්ණ කරගන්නා ලෙසටත් ඉන්පසු සෑම වර්ෂ දෙකකට වරක් ලියාපදිංචිය අළුත් කරගන්නා ලෙසත් දන්වා ලිපියක් නිකුත් කිරීමටත් ඉන්පසු ඒ අනුව කටයුතු නොකරන පෙරපාසල් සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ග | වයඹ පළාත තුළ ක්‍රියාත්මක පෙර පාසල් නියාමනය හා අධීක්ෂණයට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| යනු ලබන පූර්ව ළමා අධ්‍යාපන සංවර්ධන ආයතන, ලියාපදිංචි කළ යුතු වුවද, 2026 පෙබරවාරි 17 දිනට වයඹ පළාත තුළ පවත්වාගෙන යන පෙර පාසල් 2102 න් 615 ක් ලියාපදිංචි කිරීමකින් තොරව වයඹ පළාත තුළ ක්‍රියාත්මක ව පැවතුණි. ඒ සම්බන්ධයෙන් අධිකාරියේ අධීක්ෂණ හා කළමනාකරණ තීරණ ගැනීමක් සිදු වී නොතිබුණි. | හඳුනා ගැනීමට තීරණය කරන ලද බව. | |

**1.5.28.2 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2012 අගෝස්තු 14 දිනැති අංක DMS/D/2/93/25/12 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ 06 ඡේදය අනුව බඳවා ගැනීමේ හා උසස්වීමේ පටිපාටි විගණන දිනය වූ 2026 පෙබරවාරි 13 දින වන විටත් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | කඩිනමින් එම පරිපාටි අනුමත කර ගැනීමට කටයුතු සිදුකරන බව. | අනුමත තනතුරු සඳහා බඳවාගැනීමේ පරිපාටි අනුමත කරවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.5.29 වයඹ ප්‍රධාන අමාත්‍ය අරමුදල**

**1.5.29.1 කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1990 අංක 02 දරන වයඹ පළාතේ ප්‍රධාන අමාත්‍ය අරමුදල පිළිබඳ ප්‍රඥප්තියේ 06 වන වගන්තිය අනුව අරමුදලේ මුදල් යොදවනු ලැබිය හැකි කාර්යයන් ලෙස වයඹ පළාත තුළ දරිද්‍රතාවයට සහන සැලසීම, වයඹ පළාතේ අධ්‍යාපනය හෝ ඥානය වර්ධනය කිරීම, වයඹ පළාත තුළ ආගම නංවාලීම හා වයඹ පළාත වෙනුවෙන් | ප්‍රධාන අමාත්‍ය අරමුදලින් ආධාර ලබා ගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් වන ආකාරය මත ගෙවීම් සිදුවන බැවින් සමාලෝචිත වර්ෂය තුළ අදාල නිර්ණායකයන් සම්පූර්ණ කර වෛද්‍ය ආධාර සඳහා ඉල්ලීම් ඉදිරිපත්ව ඇති බැවින් එම ආධාර ලබා දීමට කටයුතු සිදු කර ඇති බව. | ප්‍රඥප්තියේ සඳහන් අනෙකුත් කාර්යයන් සඳහාද අරමුදල් යෙදවීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| සේවයක් කර ඇති තැනැත්තන්හට ප්‍රදානයක් කිරීම සඳහා හෝ වයඹ පළාතේ මහජනතාවගේ සුභසිද්ධිය හෝ යහපත පිණිස වෙනත් යම් කාර්යයන් සඳහා යෙදවිය යුතු වුවත්, 2024 ඔක්තෝබර් 11 දින පැවැති ප්‍රධාන අමාත්‍ය අරමුදල් පාලන කමිටුවේ දී අධ්‍යාපන හා ක්‍රීඩා කටයුතු සඳහා ආධාර ලබාදීම යන කාරණා සඳහා ප්‍රමුඛත්වය ලබා දෙමින් කටයුතු කරන බව දන්වා තිබුණ ද සමාලෝචිත වර්ෂය තුළ දී ද, වෛද්‍ය ආධාර ලෙස ප්‍රතිලාභීන් 14 කට රු.1,200,000 ක් ලබා දීම හැර වෙනත් කිසිදු කාර්යයන් සිදුකර නොතිබුණි. | | |

## 1.5.30 වයඹ පළාතේ කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ කෘෂි ව්‍යවසායකත්ව සංවර්ධන චක්‍රීය ණය අරමුදල

### 1.5.30.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වයඹ පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ කෘෂි ව්‍යවසායකත්ව චක්‍රීය ණය අරමුදලේ ගොවීන් විසින් වගාවන් සිදුකිරීම සඳහා 2025 වර්ෂයේදී ණය අයදුම්පත් 611 ක් ලබාදී තිබූ නමුත්, ඉන් ණය ලබාදුන් ණය අයදුම්පත් ගණන 271 කි. එනම් සියයට 56 ක ප්‍රමාණයක් මෙම චක්‍රීය ණය අරමුදලෙන් ණය ලබාගැනීමට යොමුවී නොතිබුණි. එනම් රු.මිලියන 225.10 ක් වෙන් කරදී තිබූ නමුත්, ඉන් රු.මිලියන 102.135 ක මුදල පමණක් භාවිතා කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘති කාර්යසාධනය සියයට සීයයක් ළඟාකර ගැනීමට අපොහොසත් වී තිබුණි. | 2025 වර්ෂයේදි කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අනුමත කරන ලද ප්‍රතිලාභීන් 611 අතරින් ප්‍රතිලාභීන් 271 දෙනෙකු සඳහා රු.102,135,000 ක මුදලක ණය ප්‍රමාණයක් නිකුත් කර තිබුණි. මෙම ණය මුදල් නිදහස් කිරීම 2026 වර්ෂයේ ද සිදුකර ඇති අතර ඉදිරියේදී සුදුසුකම් සපුරා ඇති ප්‍රතිලාභීන් සඳහා ණය නිකුත් කිරීම පිළිබඳව ප්‍රාදේශීය සංවර්ධන බැංකුව දැනුවත් කර ඇති බව. | බැංකු ක්‍රමයේ පවතින දුර්වලතාවයන් හඳුනාගෙන චක්‍රීය අරමුදලේ අරමුණු ඉටුකරගැනීම කෙරෙහි අවධානය යොමුකළ යුතුය. |

## 1.5.31 වයඹ පළාත් වාරිමාර්ග තිරසාර නඩත්තු අරමුදල

### 1.5.31.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2014 අංක 02 දරන වයඹ පළාත් වාරිමාර්ග ප්‍රඥප්තියේ III වන පරිච්ඡේදයේ 35 (1) වගන්තිය | 2025 වර්ෂය තුළ ගෙවූ රු.9,718,400 ක වාරි නඩත්තු අරමුදලින් සියයට 87 ක් පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් ගොවි සංවිධානවලට අයත් ගිණුම් 546 කට ගෙවා තිබීමෙන් එම මුදල් වාරි නඩත්තුවලට ලබාගැනීමට ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අවසරය ලබාගැනීමට සිදුවීමෙන් නඩත්තු මුදල් ලබාගැනීම ප්‍රමාද වී තිබුණි. ප්‍රඥප්තිය අනුව කළමනාකරණ සංවර්ධන කමිටුවලට ගෙවිය යුතු ලෙස දක්වා තිබුණද, කුරුණෑගල පිහිටුවා තිබුණේ එවැනි සමිති 83 ක් පමණි. | වාරිමාර්ග ප්‍රඥප්තියේ 35 (1) වගන්තියට අනුකූලව ගෙවීම් සිදු නොවීම නිසා වූ දුර්වලතා නිවැරදි කිරීම සඳහා 2026 වර්ෂය තුළදී තිරසාර නඩත්තු වැඩසටහන යටතේ ඇති සියලුම වැව් සඳහා වාරි කළමණාකරණ හා සංවර්ධන කමිටු පිහිටුවා , කමිටුව නමින් රජයේ වාණිජ බැංකුවක ගිණුමක් විවෘත කිරීමේ කටයුතු මේ වන විට සිදු කරමින් පවතින බව. | ප්‍රඥප්තියේ සඳහන් කරුණු අභිබවා කටයුතු නොකළ යුතුය. |

## 1.5.32 වයඹ පළාතේ වයඹ ධීවර සවිය චක්‍රීය ණය අරමුදල

### 1.5.32.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රතිලාභීන් 22 දෙනෙකුට රු.13,900,000 ක මුදලක් ණය ලෙස ලබාදී තිබූ අතර, එම ප්‍රමාණය මෙන් 3 ගුණයකට ආසන්න ප්‍රමාණයක් ප්‍රතිලාභීන් වෙත ණය ලබා නොදී ස්ථාවර තැන්පතු ලෙස රු.41,300,000 ක මුදලක් චක්‍රීය අරමුදලේ රඳවාගෙන තිබුණි. මේ අනුව චක්‍රීය අරමුදලේ රීති මාලාවේ 5 | 2025 වර්ෂයේදී ප්‍රතිලාභීන් 118 දෙනෙක් සඳහා රු. 86,900,000 ක මුදලක් ණය අනුමත කර බැංකු වෙත යොමු කර ඇති අතර එම පිරිසගෙන් 41 දෙනෙකු රු.32,800,000 ක ණය මුදලක් මේ වන විට ලබා ගෙන ඇත. 2025 වර්ෂයේ ණය වෙත යොමු කරන ලද සියළුම අයදුම්කරුවන්ට 2025 | බැංකු පද්ධතිය තුළින් ණය නිදහස් කිරීමේ සිදුවන ප්‍රමාදයන් හේතුවෙන් ණයදීම ප්‍රමාද වන අතර, අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටුකර ගැනීම සඳහා බැංකු පද්ධතිය මෙහෙයවා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | (I) , (II) හා (III) හි සඳහන් ධීවර හා ආශ්‍රිත කර්මාන්තයන්ගේ නියැලී සිටින ව්‍යවසායකයින්ගේ ව්‍යාපෘති දියුණු කිරීමේ අරමුණු සඳහා යොදවා නොතිබුණි. | දෙසැම්බර් 31 දින වන විටම එම ණය මුදල් ලබා ගැනීමේ කටයුතු සිදු කර අවසන් කර ගැනීමට අපහසු වන අතර එම පිරිසගේ ණය ලබා ගැනීම් වෙනුවෙන් ප්‍රතිමූල්‍යා නිකුත් කිරීමට මුදල් අවශ්‍ය වන තෙක් සිදු වන මූල්‍යාමය අවප්‍රමාණය අවම කර ගැනීම වෙනුවෙන් අරමුදල් ස්ථාවර තැන්පතුවල රඳවා ඇති බව. | |
| (ආ) | වයඹ පළාත් ධීවර අමාත්‍යාංශය විසින් සහන පොළී පදනමක් යටතේ තෝරාගත් ධීවර හා ඒ ආශ්‍රිත කර්මාන්තයේ නියැලී සිටින ව්‍යවසායකයින් වෙත ණය ලබාදීම පිණිස වයඹ පළාත් ධීවර අංශයේ ධීවර සවිය චක්‍රීය ණය අරමුදල පිහිටුවා ඇත. ඒ සඳහා සමාලෝචිත වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන අරමුදල යටතේ ලද රු.30,000,000 ක්ද චක්‍රීය ණය අරමුදලේ රු.15,609,781 ක්ද සමාලෝචිත වර්ෂය ආරම්භයේ සමුච්චිත අරමුදල රු.5,436,169 ක් ලෙස රු.51,045,950 ක්, අරමුදලේ ස්කන්ධය ලෙස පැවතුණද සමාලෝචිත වර්ෂයේ ලබාදුන් මුළු ණය ප්‍රමාණය රු.13,900,000 ක් වූයෙන් ණය ලබාදීම මුළු අරමුදලෙන් සියයට 27 ක් තරම් ඉතා අඩු අගයක පැවති අතර, ඒ අනුව මෙම අරමුදලෙහි අරමුණට ළඟාවීම සතුටුදායක මට්ටමක නොපැවතුණි. | 2025 වර්ෂය ආරම්භයේ ණය ගැති ශේෂය 13,436,277 ක් වූ අතර එය වර්ෂය තුළ ණය දීම් රු.13,900,000 ත් සමඟ වර්ෂය අවසාන වන විට ණය ගැති ශේෂය රු. 20,151,633 ක් විය. එය 2025 වර්ෂය අවසානයේ මුළු ස්කන්ධය වන රු.66,653,617 න් සියයට 30 කි. මෙම ප්‍රතිශතය ඉහළ දමා ගැනීම සඳහා අවශ්‍ය කටයුතු ධීවර අංශය මගින් මේ වන විටත් සිදු කරනු ලබන බව. | අරමුණු ඉටුකර ගැනීමට අමාත්‍යාංශය මෙන්ම බැංකු පද්ධතියද එකසේ කටයුතු කළ යුතුය. ඒ සඳහා කළමනාකරණය සෘජුව මැදිහත්වීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ධීවර සවිය චක්‍රීය ණය අරමුදල මඟින් ප්‍රතිලාභීන් 118 දෙනෙකුට රු.86,900,000 ක් ණය අනුමත කර තිබුණද, එම ප්‍රතිලාභීන්ගෙන් 18 දෙනෙකුගේ රු.11,700,000 ක් වටිනා ණය පමණක් 2025 වර්ෂයේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුව විසින් ලබාදී තිබුණි. ඒ අනුව 2025 වර්ෂයේ ප්‍රතිලාභීන් 118 කට අනුමත කළ ණය මුදලින් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව දෙසැම්බර් 31 දිනට | එකතුව රු.75,200,000 ක නොදුන් ණය මුදලින් 2025 වර්ෂයේ අනුමත කළ ණයගැතියන් 23 ක් වෙනුවෙන් රු.21,100,000 ක ණය මුදලක් 2026 මාර්තු 31 දින වන විට ප්‍රතිලාභීන්වෙත නිකුත් කර ඇති අතර ඉතිරි රු.54,100,000 ට අයත් ණය අයදුම්කරුවන්ගෙන් සියයට 70 ක පමණ ණය අයදුම්පත්‍ර ණය ලබා ගැනීමේ ක්‍රියාවලිය තුළ පවතී. ඇපකරුවන් සොයා ගැනීමේ | ප්‍රතිලාභීන් සඳහා ණය ලබාදීමට යොදාගන්නා බැංකු පද්ධතියේ පවතින දුර්වල ක්‍රියාකාරීත්වය හේතුවෙන් දීර්ඝ ප්‍රමාදයක් සිදුවන බැවින් අමාත්‍යාංශය විසින් ඊට සුදුසු ක්‍රමවේදයන් සකස් කිරීමට කටයුතුකළ යුතුය. |

| | | |
|---|---|---|
| ලබා නොදුන් ණය ප්‍රමාණය රු.75,200,000 ක් හෙවත් සියයට 87 ක ප්‍රතිශතයක් වූයෙන් ණය කඩිනමින් ලබාදීම සඳහා අදාළ බැංකුව සමඟ නිසි ක්‍රමවේදයක් පිළියෙල කර නොතිබුණි. | දුෂ්කරතා, බැංකුව විසින් ණය ලබා දීමට සලකා බලන නිර්ණායක නොසැපිරීම, අයදුම්කරුවන්ගේ වෙනත් පෞද්ගලික හේතු ආදිය නිසා ණය ලබා නොගැනීම් හැරුණු විට අනෙකුත් අයදුම්කරුවන්ට ණය ලබා ගැනීම සඳහා අවශ්‍යය සෑම අවස්ථාවකදීම බැංකුව සමඟ සම්බන්ධීකරණ කටයුතු ධීවර අංශය මඟින් සිදු කරනු ලබන බව. | |

## 1.5.33 වයඹ දිරිය නිවාස ණය යෝජනා ක්‍රමය

### 1.5.33.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආණ්ඩුකාරවරගේ 2021 මාර්තු 12 දිනැති අනුමැතිය ලද වයඹ දිරිය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලාභ බෙදියාම සැලකීමේදී දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කරනු ලබන ප්‍රතිමූල්‍ය පහසුකම මත ලැබෙන පොලී ආදායමෙන් 3/8 ක් (සියයට 37.5) නිවාස දෙපාර්තමේන්තුවටද ඉතිරි 5/8 ක (සියයට 62.5) බැංකුවට ද හිමිකම් ලැබේ. එසේ වුවද 2010 දෙසැම්බර් 10 දින අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි ප්‍රතිලාභ බෙදීයාම දක්වා ඇත්තේ නිවාස දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කරනු ලබන ආයෝජිත සියයට 60 ක ප්‍රමාණයෙහි පොලිය රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව හා නිවාස දෙපාර්තමේන්තුව අතර 6:2 අනුපාතයට බව දක්වා ඇත. මෙම කරුණු පිලිබඳ නිවැරදි කිරිම මේ දක්වා සිදුකර නොමැත. ඒ අනුව ඉකුත් වර්ෂයේ හා සමාලෝචිත වර්ෂයේ අහිමි වූ ලාභය පිළිවෙලින් රු.870,595 හා රු.1,047,262 ක් විය. | “වයඹ දිරිය” ණය යෝජනා ක්‍රමයට අදාලව අනුමත කර ඇති රීති මාලාවට අනුශාංගිකව අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීම සඳහා බැංකුවේ එකඟතාවය ලබා දී නොමැති බැවින් හා රීති මාලාව ගැසට් පත්‍රයේ පළකර නොමැති විම හේතුවෙන් විගණනය පෙන්වාදී ඇති තත්ත්වය උද්ගත වී ඇති බව. | අනුමත කර ඇති රීති මාලාවට අනුශාංගිකව අවබෝධතා ගිවිසුම සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |